ක්‍රිස්තුස් වහන්සේගේ

# පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"දෙවියන් වහන්සේට ළංවෙයල්ලා. එවිට උන්වහන්සේ නුඹලාට ළංවෙන සේක" යාකොබ් 4 : 8)

81 වන වෙළුම අංක 01 (961) 2022 ජනවාරි / පෙබරවාරි

# දෙවියන් වහන්සේ සමඟ මුණගැසීම

හෙන්රි බැලැකබේ විසිනි

අපි දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය තුළ සිටින විට උන්වහන්සේ විප්ලවීය වෙනසක් ගෙන එන සේක. අපි මෙය ශුද්ධ ලියවිල්ල තුළම දකින්නෙමු. නමුත් ශුද්ධ ලියවිල්ලේ අපට හමුවන්නේ දෙවියන් වහන්සේ බව අපි අවබෝධ කරගෙන නැත. දෙවියන් වහන්සේගේ ගෘහයට පැමිණීමේ අපගේ මූලික අරමුණ දෙවියන් වහන්සේව මුණගැසීමයි. අපි දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ සිටින බව අපි පවසන්නට පුළුවන. නමුත් අපි දේව අභිමුඛත්වයේ සිටින බව පෙනෙන පරිවර්තනීය වෙනසක් දැකීමට නොතිබිය හැකිය.

දෙවියන් වහන්සේ ඔබව හමුවීමේ මොහොත තීරණය කරනු ලබන්නේ උන්වහන්සේ මිස ඔබ විසින් නොවේ. එම හමුවීම සමහරවිට ශුද්ධ ලියවිල්ල තුළින් විය හැකිය. ක්ෂණිකවම දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ දෙමුවහත් කඩුවක් ලෙස ශුද්ධ ලියවිල්ල රැගෙන ආත්මය, ප්‍රාණය, සන්ධි හා ඇටමිදුළු ද වෙන්කරන තරමට කාවදිමින් සිතේ සිතුවිලිද අදහස් ද සෝදිසි කරන්නේය. (හෙබ්‍රෙව් 4:12) එය ඔබව සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේට නිරාවරණය කරයි. දෙවියන් වහන්සේ ඔබව මුණගැසෙන විට ඔබගේ ජීවිතයේ සෑම කුඩා අංශුවක්ම (අවුන්සයක්ම) කලවම් කරන සේක.

## දෙවියන් වහන්සේ සමඟ යෙසායාගේ මුණගැසීම

දෙවියන් වහන්සේ යෙසායාව මුණ ගැසුණු විට සිදු වූ අපූර්ව වූ සිදුවීම යෙසායා 6 වන පරිච්ඡේදයේ අපි දකින්නෙමු. යෙසායාගේ ප්‍රශ්නය තිබෙන්නේ කොහෝදැයි දෙවියන් වහන්සේ නිශ්චිතවම දැන සිටි සේක. එම නිසා දෙවියන් වහන්සේ යෙසායාගේ ජීවිතයේ විප්ලවීය වෙනස සඳහා අවශ්‍ය උන්වහන්සේගේ මුණගැසීම ගලපනු ලැබූ සේක. ක්ෂණිකවම යෙසායා ශුද්ධ වූ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ සිටියේය. සමහර මනුෂ්‍යයන් ශුද්ධ වූ දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ පැවතීම පිළිබඳව කථාකරයි. එමෙන්ම අපි උන්වහන්සේගේ ශුද්ධකම පිළිබඳව ගායනා කරන්නෙමු. එසේ වුවත් අපි දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය අත්දකින්නේ නැත. අපි දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ සිටියා නම් අපි බොහෝ දෙනා **යෙසායා මෙන් ප්‍රතිචාරය දක්වනු ඇතැයි මම සිතමි. "එවිට මම කථාකොට, අහෝ මට දුක්වේ වක්නිසාද මට විනාශය විය. කුඹක් හෙයින්ද අපවිත්‍ර තොල් ඇති මනුෂ්‍යයෙක්ව සිටින්නා වූ, අපවිත්‍ර තොල් ඇති සෙනඟක් අතරේ වසන්නා වූ මම සේනාවල ස්වාමී වූ රජ්ජුරුවන් වහන්සේ මාගේ ඇස්වලින් දුටුවෙමියි කීවි."** (යෙසායා 6:5)

දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය සහ ශුද්ධකම සෑමවිටම දෙවියන් වහන්සේ සමඟ ගැඹුරු හමුවීමකින් ඔබට වළක්වන ඔබේ ජීවිතයේ නිශ්චිත අවශ්‍යතාවය අනාවරණය කරනු ලබයි. යෙසායා සමඟ දෙවියන් වහන්සේගේ ක්ෂණික ප්‍රතිචාරය වූයේ ඔහුගේ තොල් පවිත්‍ර කිරීමයි. දෙවියන් වහන්සේගේ පූජාසනයෙන් යම් දෙයක් පැමිණිය යුතු අතර එය ජීවිතය වෙනස්කරන මොහොතකි. පූජාසනයේ ගිනි අඟරුවලින් ඔහුගේ තොල් ස්පර්ශ කිරීමෙන් පුදුම වූ කාරණා සිදු විය. ඔහුගේ තොල් පවිත්‍ර කරනු ලැබූ විට ඔහුගේකන් විවෘත විය. දෙවියන් වහන්සේ ඔහුගේ කන් ස්පර්ශ නොකළ සේක. උන්වහන්සේ ස්පර්ශ කළේ යෙසායාගේ තොල්ය. දෙවියන් වහන්සේ මුළු කාලය පුරාම කථා කරමින් සිටිය නමුත් යෙසායාට ඇහුම්කන්දීමට නොහැකිව සිටියේය. නමුත් මෙහිදී පළමුවරට දෙවියන් වහන්සේ කියන දේ යෙසායාට ඇසුණේය. **"මම කවරෙකු යවවිද... ? අප වෙනුවෙන් යන්නේ කවුද ..? "මක්නිසාද දෙවියන් වහන්සේව මුණ ගැසීමෙන් විප්ලවීය වෙනසක් සිදුවිය. එහිදී නිරායාසයෙන්ම යෙසායා තුළ ප්‍රතිචාරය හටගත්තේය. "මෙන්න මම මෙහිය, මා යවිව මැනව"** (යොසායා 6:8) යෙසයාව මුණුගැසුණා වූ දෙවියන් වහන්සේම අපවත් මුණගැසීමට මෙහි බලාසිටින සේක.

## අපගේ ජාතිය උදෙසා යාච්ඤා කරන්න

අපි කුමන දෙයක් කරත්, එසේ නැති නම් මොනවා නොකර සිටියත් ජාතිය මේ තිබෙන තත්ත්වයට පැමිණ තිබෙනවා. අපගේ ජාතිය භයානක තත්ත්වයක සහ පහළට, පහළට ගමන් කරන්නා වූ ක්‍රියාමාර්ග සිය ගණන් ගෙන තිබේ. ජාතියේ වෙනසක් සිදු වී නැත්තේ අපි කරන්නා වූ යාච්ඤාවන් මොනවගේ ද කියන ප්‍රශ්නය මතවේ. යාච්ඤාවට පිලිතුරු වශයෙන් මුළු ස්වර්ගයම සොලවන බව දෙවියන් වහන්සේ පවසා ඇති බව අපි දැන දැනත් ජාතිය පවතින තත්ත්වයේම පැමිතීමට ඉඩ හැර තිබෙන්නේ අපගේ කුමන ආකාරයේ යාච්ඤාවක් ද ? එක් පුද්ගලයෙකුගේ උද්යෝගිමත් යාච්ඤා කිරීමකට අපගේ ජාතිය නැවත හැරවිය හැකිය. අපි යාච්ඤා කරනවා කියා අපි පවසනවා නම් අපගේ ජාතිය ආපසු හැරෙන්නේ නැත්තේ ඇයි ... ?

දෙවියන් වහන්සේ සමඟ ගුණාත්මකව වෙනස් වූ සම්බන්ධතාවයක් ඇතිකර ගැනීමට යාච්ඤා කිරීමේදී අපට අවශ්‍යය වී නැත. ඔබ යාච්ඤා කරන විට උන්වහන්සේ සමඟ ගුණාත්මකව වෙනස් වූ සම්බන්ධතාවයක් ඔබ තුළ ඇති කිරීමට ඔබ සූදානම්ද ... ? යාච්ඤා කිරීමට ඔබව දෙවියන් වහන්සේ විසින් කැඳවීමට හැකි ආකාරයේ පුද්ගලයෙකුවීමට ඔබට අවශ්‍යද ... ? මක්නිසාද ඔබ උන්වහන්සේ සමඟ ඇති ගුණාත්මක සම්බන්ධතාවය තුළින් සහ ඔබගේ යාච්ඤා කිරීමෙන් ජාතිය සහ ලොව පුරා විශාල වෙනස්කම් සිදුවනු ඇති බව උන්වහන්සේ දැන සිටින සේක. දෙවියන් වහන්සේ සමඟ ඔබගේ පුද්ගලික ගමන් කිරීම සහ ඔබගේ පුද්ගලික යාච්ඤා ජීවිතය පිළිබඳවත් සිතා බලන්න. දෙවියන් වහන්සේට ඔබගේ ජීවිතය තුලින් ගැඹුරින්ම ක්‍රියා කිරීම හැකිවන පරිදි ඔබේ ජීවිතයේ කුමන ආකාරයේ වෙනස්කම් කළ යුතුද කියාත් සිතා බලන්න.

## මෝසෙස්ගේ යාච්ඤා ජීවිතය

මෝසෙස් විසින් කරනු ලැබූ සමහර යාච්ඤාවන් සහ පරදුවට තැබූ සමහර දේවල් දෙස අවධානය යොමු කිරීමට මා සමඟ එක්වෙන්න. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ අභිමුඛත්වයේ සිටිමින් උන්වහන්සේගේ හදවතෙ තිබෙන්නා වූ දේ ඔහුගේ හදවතින්ම ඇසීමට මෝසෙස්ට ආරාධනා කළ දෙවියන් වහන්සේ ඔහුගේ හදවත බිඳ දමා රැ දහවල් හතලිහක් දෙවියන් වහන්සේ ඉදිරියේ සිට යාච්ඤා කිරීමට මෝසෙස්ව පෙළඹවූ සේක. ඔහු දෙවියන් වහන්සේගෙන් අසා ඇති දේ මොනතරම් වැදගත් ද කිවහොත් ඔහු දින හතලිහක් කිසිවක් නොකා, නොබී ආත්මයේ දැඩි වේදනාවෙන් සිටියේය. සෙනඟගේ පාපය සහ දෙවියන් වහන්සේ අතරමැද මෝසෙස් සිටිමින් සෙනඟ උදෙසා ආයාචනා කළේය. එමෙන්ම තමන්ගේ නම වවුත් ජීවන පොතෙන් මකා දමා ඔවුන්ව ජීවන පොතෙන් ඉවත්කර නොදමන ලෙස ඉල්ලා සිටියේය. මෝසෙස්ගේ ජීවිතයේ තිබූ යාච්ඤා කිරීම දෙවියන් වහන්සේගේ සිත වෙනස් කළ බව ශුද්ධලියවිල්ලේ සඳහන්ව තිබේ.

අවසාන වතාවට ඔබ යාච්ඤා කිරීමට ගිය විට දෙවියන් වහන්සේ උන්වහන්සේගේ හදවත ඔබගේ හදවත මත තැබූ අතර එය ඔබගේ හදවත බිඳ දැමුවාද ... ? අපි යුතු ලෙස යාච්ඤා කිරීමට නොදැන සිටීම අපේ එක් දුර්වලකමක් බව පාවුල්තුමා රෝම 8:26 වන පදයේ සඳහන් කර ඇත. යාච්ඤා කළ යුතු දේ දැන ගැනීමට අපට ඇති නොහැකියාව වෙනුවෙන් දෙවියන් වහන්සේගේ පිළියම කුමක්ද .. ? ශුද්ධාත්මයාණන් වහන්සේව අපට ලබා දී ඇති බව පාවුල්තුමා පවසා තිබේ. ශුද්ධාත්මයාණන් වහන්සේ, දෙවියන් වහන්සේගේ මනස සහ සිත දන්නා සේක. එමෙන්ම දෙවියන් වහන්සේගේ ක්ෂණික ක්‍රියාකාරිත්වය ද දන්නා සේක. එම නිසා උන්වහන්සේ ඔබට මඟ පෙන්වමින් යුතු ලෙස යාච්ඤා කිරීමට දණින් සිටි විට ස්වාමීන් වහන්ස .... මම යුතු ලෙස යාච්ඤා කිරීමට නොදනිමියි කියා මොර ගැසීමට සිතුවාද .. ? අපගේ ජාතිය විනාශයට පත්වී ඇත. ඊළඟට මම යාච්ඤා කරන්නේ කෙසේද .. ? යාච්ඤා කළ යුතු ආකාරය දෙවියන් වහන්සේ ඔබේ සිතට හඟවා දෙන්නේ නම්, දෙවියන් වහන්සේ අසා පිළිතුරු දුන් බව ඔබ දැනගන්නා තුරු උද්යෝගයෙන් යාච්ඤා කරනවාද .... ?

ඔබගේ යාච්ඤා ජීවිතයට සහ ඔබගේ දේවස්ථානයේ යාච්ඤා කිරීම්වලට ඉතිහාසයේ ගමන් මඟ තීරණය කළ හැකි අතර අද අපගේ ජාතියේ ඉතා දුර්වලවී ඇති බොහෝ විනාශකාරී බලවේගත් මගහැරිය හැකිය. අපගේ ජාතියේ පවුල් ජීවිත විශ්වාස කළ නොහැකි අන්දමට බිඳවැටීමේ අත්දැකීම්වලට මුහුණදී ඇත. උසස් ස්ථානවල ආචාර ධර්ම සහ වෙනත් පෙර නොවූ විරූ ආකාරයෙන්, අපි කිසිදා අසන්නට ලැබේ යැයි සිහිනෙන්වත් නොසිතූ දේවල් අසන්නට සිදුවී ඇත. එමෙන්ම ඒවා දැන් සාමාන්‍ය දේවල් බවට පත්වී තිබේ. දෙවියන් වහන්සේගේ සෙනඟගේ යාච්ඤා කිරීම කොහේද ... ? දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන්නේ ජාතියක් තම සෙනඟගේ යාච්ඤාවේ ප්‍රතිඵලය බවට පත්වීමයි. සිය ගණන් යාච්ඤා කිරීම්වලදී මම දැක ඇති පරිදි අපගේ ජාතිය නොසැලකිලිමත්ව සහ දෙවියන් වහන්සේගේ සෙනඟ ඕනෑවට එපාවට

2 පිටුවට

1 පිටුවෙන්

# දෙවියන් වහන්සේ...

යාච්ඤා කරමින් දෙවියන් වහන්සේ ඔවුන්ගේ යාච්ඤාව කරුණුකොටගෙන ජාතිය මත බලපෑමක් ඇති කිරීමට බලයෙන් පූර්ණව සිටින බව බොහෝ සේ විශ්වාස කරන්නේ නැත.

දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේ සමඟ ඇතුලාන්තයෙන් සම්බන්ධතාවය පවත්වා ගැනීමට බොහෝ සේ ආශාවක් නොදන්වන විට සිදුවන්නේ කුමක්දැයි ඔබ දන්නවාද .. ? එය දෙවියන් වහන්සේගේ උදහස අවුස්සන්නේය. මක්නිසාද දෙවියන් වහන්සේ සමඟ උන්වහන්සේගේ සෙනඟ සම්බන්ධතාවය ඇතිව ක්‍රියාකරන්නේ නැති විට සදාකාලයටම අවදානමට ලක්වන බව උන්වහන්සේ දන්නා සේක. මෝසෙස් මෙලෙස පැවසුවේ එම නිසාය. **"හොරේබ්හිදීන් නුඹලා ස්වාමීන් වහන්සේ උදහස් කළහුය. ස්වාමීන් වහන්සේ ද නුඹලා විනාශ කරන තරමට නුඹලාට කෝප වූ සේක."** (ද්විතිය කථාව 9:8)

නමුත් දැන් ඊශ්‍රායෙල් දෙස බලන්න එපා. ඊශ්‍රායෙල්ගේ දෙවියන් වහන්සේ දෙස බලන්න. ඔබ කුමන ආකාරයක හෝ ආත්මික නායකයෙක් නම් එමෙන්ම ඔබ දෙමව්පියන් නම් දෙවියන් වහන්සේගේ සෙනඟට උන්වහන්සේට ඔවුන්ව විනාශ කරන පිණිස උන්වහන්සේව කෝප කළ හැකි බව මතක තබාගන්න. මුළු ඉතිහාසය පුරා සෑම අවස්ථාවකදීම මේ ජාතිය විනාශ කර තිබුණේ ද ... ? එම අවස්ථාව දැන්ද ... ? දෙවියන් වහන්සේගේ බලවත් හස්තයෙන් පමණක් එය වළක්වා ගත හැකිය.

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟ සමඟ උදහස්වී සිටින බව දෙවියන් වහන්සේ මෝසෙස්ට පැවසූ සේක. මක්නිසාද ඔවුන්ගේ පාපය නිසා උන්වහන්සේ මුළු සෙනඟවම විනාශ කර මෝසෙස් සමඟ නැවත ආරම්භ කිරීමට සූදානම් වූ සේක. ඔබ කන්ද උඩ සිටි විට දෙවියන් වහන්සේ ඔබට එසේ කී සේක් නම් ඔබ කරන්නේ කුමක් ...? එය ඔබගේ යාච්ඤා ජීවිතයේ ඔබගේ ස්වභාවය මත රදා පවතියි. ඔබ දෙවියන් වහන්සේව කොයිතරම් හොඳින් හඳුණනවාද..? සෙනඟගේ පැවැත්ම වෙනුවෙන් දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා අතර සිටීමට දෙවියන් වහන්සේ කරන්නා වූ ආරාධනවා ඔබ කොයිතරම් හොඳින් දන්නවාද ...? ද්විතිය කථාව 9 සහ 10 පරිච්ඡේදවල මෝසෙස් දෙවියන් වහන්සේගේ සෙනඟට විස්තර කරන්නේ තමා දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය තුළට පැමිණි බවත් දින හතලිහක් රෑ දහවල් දෙවියන් වහන්සේට ආයාචනා කළ බවත්ය. අවස්ථා දෙකක්දී එය කළ බවත් සඳහන් කරන්නේය. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ සෙනඟ සියල්ලන්ව විනාශ කරන්නට යන බව පැවසූ සේක. මොසෙස්ගේ පසු නොබසින උත්සහයෙන් හා හදවතින් යාච්ඤා කිරීම නිසා දෙවියන වහන්සේ ඇහුම්කන්දී උන්වහන්සේගේ සෙනඟව විනාශ නොකළ සේක.

## දෙවියන් වහන්සේගේ හදවතේ ඇති දේ ...

දෙවියන් වහන්සේගේ හදවතේ ඇති දේ දැන ගැනීම වැදගත් යැයි ඔබට හැඟුණ අවසාන අවස්ථාව කවදාද ... ? ඔබගේ දරුවන් උදෙසා දෙවියන් වහන්සේගේ හදවතේ තිබෙන්නේ මොනවාද ... ? ඔබගේ සභාව උදෙසා දෙවියන් වහන්සේගේ හදවතේ තිබෙන්නේ මොනවාද ... ? අවසානයේ දී ඔවුන් පව්කර තිබෙන නිසා දෙවියන් වහන්සේට උන්වහන්සේගේ සභාවලින් එකක් විනාශ කළ හැකිද .. ? දෙවියන් වහන්සේට සභාව මරණයට පත්වීමට ඉඩ හැරිය හැකිද .. ? උන්වහන්සේ එපිස සභාවට මෙලෙස අනතුරු ඇඟවූ සේක. **"නුඹ, නුඹේ පළවු ප්‍රේමය අත්හැර තිබේ."** දෙවියන් වහන්සේ ඔවුන්ට පැවසුවේ, ඔවුන් වැටී සිටින්නේ කොතැනින් දැයි ඔවුන්ට මතක නැති නම්, ඔවුන්ට කලින් තිබූ දේ මතක නැතිනම් එය සිහිකර පසුතැවිලිවී හැරී නොඑන්නේ නම් උන්වහන්සේ ඔවුන්ගේ පහන් රුක ස්වකීය ස්ථානයෙන් අයින් කරන බවයි. ඔවුන් පවතින තත්වයෙන් ඉවත්කරන සේක.

ඔබ කවදාවත් නොදැන සිටි යාච්ඤා කිරීමේ ස්වභාවයක් (මට්ටමක්) සඳහා දෙවියන් වහ්නසේ ඔබව ක්‍රියාවේ යෙදවීමට පටන්ගෙන ඇති බව ඔබට හැගෙනවාද .. ? උන්වහ්නසේ සමඟ ඇති එම නව සම්බන්ධතාවය තුළ අපගේ දවසේ කාරණා වලදී උන්වහන්සේගේ සිත සහ මනස ඔබගේ හදවත මත තැබීම අවශ්‍යව තිබෙන සේක. මෝසෙස් දෙවියන් වහන්සේගේ හදවතේ ඇතිදේ දැනගත් විට වහාම ගොස් දැඩි ලෙස මැදහත්කාරකම් කළෝය. කෙසේ වෙතත් දෙවියන් වහන්සේ උන්වහන්සේගේ වචනය කථා කිරීමට උන්වහන්සේව විශ්වාස කරන යම් කෙනෙක්ව යම් තැනකින් සොයා ගන්නා සේක.

අපගේ ජාතියේ බලාපොරොත්තු රහිත අවශ්‍යතාවයන්වලදී දෙවියන් වහන්සේ බලාසිටින්නා වූ කාරණය එයයි. මෙම කාරණය ඉටු කළ හැකිවන්නේ දෙවියන් වහන්සේගේ සෙනඟට පමණි. දේශපාලනඥයින්ට මෙම කාර්යය ඉටු කළ නොහැකිය. දෙවියන් වහන්සේගේ සෙනඟට ඔවුන්ගේ හදවත්වල දෙවියන් වහන්සේගේ ක්‍රියාව හැගෙන විට සහ ඔවුන්ව උන්වහන්සේ සමඟ ගැඹුරු සම්බන්ධතාවයට ඇදගනු ලබන විට ඔවුන්ට දිව්‍යමය අවස්ථාවක් ලැබී තිබෙන්නේය. මක්නිසාද දෙවියන් වහන්සේගේ සිතේ සහ මනසේ ඇතිදේ දැනගෙන ක්‍රියාකිරීම උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. දෙවියන් වහන්සේ මෙම කාර්යය ඔබ තුළ ඉටු කිරීමට ඔබ සූදානම්ද ... ? ස්වාමීනී, මාගේ ජීවිතයේ සම්පූර්ණයෙන්ම ඔබ වහන්සේව දැනගෙන මුළුමනින්ම ඔබවහන්සේට විවෘතව සිටීමට කැමැත්තෙමි කියා උන්වහන්සේ ඉදිරියට පැමිණ පැවසීමට ඔබ කැමතිද ... ? දෙවියන් වහන්සේ ඔබගේ හදවත මත උන්වහන්සේගේ හදවතේ ඇති දේ තබන බව ඔබට විශ්වාස කළ හැකිය. උන්වහන්සේ එලෙස කරන බව විශ්වාස කරන්නේ නම් උන්වහන්සේ එය ඉටු කිරීමට හැකියාව ලබාදෙන බවත් විශ්වාස කළ හැකිය. අපේ ජාතිය මධ්‍යයේ ඔබගේ ජීවිතය තුලින් දෙවියන් වහන්සේගේ බලවත් වූ අභිමුඛත්වය ප්‍රකාශ කිරීමට ඔබව පාවිච්චි කරන පිණිස ඉඩදෙන්න.

## උද්යෝගිමත්ව, ස්ථිර ලෙස නොකඩවා යාච්ඤා කිරීම

යාච්ඤා යනු ඔබට උවමනා කුමක්ද , එය ඉටුකිරීමට දෙවියන් වහන්සේට පැවසීමට ඇති අවස්ථාවක් නොවේ. යාච්ඤා කිරීම යනු දෙවියන් වහන්සේ ඉදිරියේ සිටීමයි. එහිදී උන්වහන්සේගේ සිතේ සහ මනසේ ඇති දේ උන්වහන්සේගේ කරුණාව කරුණුකොටගෙන අපට පවසන සේක. එමෙන්ම යාච්ඤා කිරීම යනු ඔබගේ ජීවිතයේ ක්‍රියාමාර්ග, කථාව, සැලසුම්, කාලය වැයකිරීම් වෙනස්වීම පිළිබඳව විප්ලවීය වෙනසක් සිදුවීමට මුණගැසීමයි.

ඔබගේ ජාතිය මේ මොහොත් සිටින්නේ තිරණාත්මක අවස්ථාවකද .... ? විප්ලවීය වෙනසක් අවශ්‍ය බව ඔබ සිතනවාද ... ? දෙවියන් වහන්සේ පිළිබඳව අවබෝධ කරගන්නා වූ යම් කෙනෙක් තුලින් දෙවියන් වහන්සේගේ බලවත් වූ ස්පර්ශය අවශ්‍ය බවත්, දෙවියන් වහන්සේගේ හදවතේ ඇති දේ අවබෝධ කරගෙන උන්වහන්සේගේ ප්‍රතිචාරය ලැබෙන තෙක් දැඩි උද්යෝගයෙන් යාච්ඤා කරන්නා වූ කෙනෙක් අවශ්‍යය බවත්, ඔබ විශ්වාස කරනවාද ... ? කෙටි යාච්ඤා කිරීමකට එය කළ නොහැකිය. ඒ සඳහා උද්යෝගමත්ව, ස්ථිර ලෙස, නොකඩවා යාච්ඤා කිරීමට කැමති විය යුතුය.

ලූක් සුභාරංචියේ 18 වන පරිච්ඡේදයේ දී යේසුස් වහන්සේ අපට නොමැලිව නිතර යාච්ඤා කළ යුතු බව පවසා තිබෙන සේක. උන්වහන්සේ උපමාවකින් කථා කරමින්, විනිශ්චයකාරයා වෙත පැමිණි කාන්තාවක් විනිශ්චයකාරයා ඇගේ ඉල්ලීම පිළිගන්නා තෙක් නොපසුබටව අයැදීම ගැන ප්‍රකාශ කළ අතර, ඊළඟට ස්වර්ගීය පියාණන් වහන්සේ උන්වහන්සේට රෑ දවල් මොරගසන්නා වූ අයට ඇහුම්කන් දෙන බව පැවසූ සේක. ඉන්පසුව උන්වහන්සේ මුළු බයිබලයේම සඳහන් කාරණා අතරින් ඉතා කණගාටුදායක ප්‍රකාශයකින් එම උපමාව තුලින් පැවසූ දේ අවසන් කළ සේක. ..... **"එසේ වී නමුත් මනුෂ්‍ය පුත්‍රයා එන කල්හි පොළොවේ ඇදහිල්ල සම්බවේදැයි කී සේක."** (ලූක් 18:8)

දෙවියන් වහන්සේට අපගේ හදවත් විවෘත කරන්නේ නම් උන්වහන්සේව අවබෝධ කරගන්නා වූ, උන්වහන්සේව විශ්වාස කරන සහ මේ වන විටත් උන්වහන්සේගේ අභිමුඛත්වයේ සිටීමට කාලය වැය කරමින් දැඩි ලෙස කැපවී සිටින්නා වූ අයව සොයා ගැනීමට හැකිවේ. මේ පැයේදී නිශ්චිතවම අපේ ජාතිය තුළ පවතින්නේ මෙවැනි අවශ්‍යතාවයකි. දෙවියන් වහන්සේගේ සිතේ සහ මනසේ යම් කාරණා තිබෙන සේක. දෙවියන් වහන්සේගේ සිතේ සහ මනසේ තිබෙන කාරණා උන්වහන්සේගේ දරුවන් අවබෝධ කරගැනීම මත ඔවුන් යාච්ඤා කිරීමට යද්දී එම කාරණා අනුව යාච්ඤා කරති. ඔබගේ පුද්ගලික යාච්ඤාවේදී, පවුලක් වශයෙන් යාච්ඤා කරද්දී, දෙදෙනෙක් ලෙස හෝ සභාවක් ලෙස යාච්ඤා කරද්දී දෙවියන් වහන්සේගේ සිතේ සහ මනසේ තිබෙන්නේ කුමක්දැයි අවංකවම අවබෝධ කරගෙන යාච්ඤා කරනවාද කියා මම ඔබෙන් අසමි. දෙවියන් වහන්සේ කරන්නට යන ඕනෑම දෙයකට සම්බන්ධවීමට අදහස් කරන විශ්මය ජනක යාච්ඤා කිරීමේ බරක් ඔබගේ ජීවිතය තුළ ක්‍රියාත්මකවී තිබෙනවාද ... ? එසේ නැති නම්. මම දෙවියන් වහන්සේගේ දරුවෙක් නමුත් මම අවංකවම යාච්ඤා කිරීමට සම්බන්ධවී නැතැයි ඔබ පවසන්නේද ... ?

බයිබලයේ සියලු ක්‍රියාමාර්ගවල දී දෙවියන් වහන්සේ යම් දෙයක් කරන විට යම් කෙනෙක් උන්වහන්සේ ඉදිරියට පැමිණ යාච්ඤා කරන නිසා දෙවියන් වහන්සේ ඒ දෙස බලා උන්වහන්සේගේ සිත ඔවුන්ගේ හදවත සහ යාච්ඤාව මත තබන සේක. මෙම තීරණාත්මක අවස්ථාවේ දී ඔබ එලෙස යාච්ඤා කරන අයගෙන් කෙනෙක්ද ... ? ඔබ සම්බන්ධ වන්නේ කුමකටදැයි සමහර විට ඔබ නොදැන සිටිනවා විය හැකිය. නමුත් එක කාරණයක් ඔබ අවබෝධ කරගත යුතුය. මේ මොහොත මගහැර යන්න දෙන්න එපා කියා දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ ඔබට පවසන සේක. දෙවියන් වහන්සේ ඔබගේ ජීවිතය සෝදිසි කර බලන සේක. උන්වහන්සේ ඔබව ක්‍රියාවෙහි යොදවන සේක. ඔබට මගපෙන්වීමට උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. යාච්ඤා කළ යුත්තේ කෙසේදැයි ඔබට ඉගැන්වීමට උවමනා නිසා ඔබගේ ජීවිතයේ දෙවියන් වහන්සේ නිර්මාණය කරන්නා වූ වෙනස අවබෝධ කරගන්න. එමෙන්ම අතීත ක්‍රියාවලින් නැවත හැරී එන්න. අපෝස්තුළු පාවුල් මෙලෙස පැවසුවේය. **"එහෙයින් උන්වහන්සේ වෙත සිටින නමුත්, අත්ත්ව සිටින නමුත් උන්වහන්සේට ප්‍රසන්න වූ තැනැත්තන්වීම අපේ අභිප්‍රාය කරගනිමුව. එක්නිසාද එකිනෙකා තම තමාගේ ශරීරයේ දී කළා වූ දේවල වළ, ඒ දේ යහපත් වුවත්, අයහපත් වුවත් කළ දේවල හැටියට ලබන පිණිස අපි සියල්ලෝම ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියෙහි ප්‍රකාශවෙන්ට ඕනෑය. එබැවින් ස්වාමීන් වහන්සේ කෙරෙහි භයවීම කිවෙක්දැයි දන්නා වූ අපි මනුෂ්‍යයන් පොළඹවමුව. නමුත් අපි දෙවියන් වහන්සේට ප්‍රකාශ කරනු ලැබ සිටිමුව. නුඹලාගේ හෘදය සාක්ෂිවලට ද අපි ප්‍රකාශව සිටිමු යයි විශ්වාස කරමි."** (2 කොරින්ති 5:9-11)

ඉතිහාසයේ ගමන්මඟ වෙනස්කරන යාච්ඤාවේ පුද්ගලයෙකුවීමට ඔබගේ ජීවිතයේ ඇති පෙළඹවීම හෝ පෙළඹවීමක් නැතිවීමට හේතුව කුමක්ද ... ? එමෙන්ම ඔබගේ පවුල තුළ, ඔබගේ සභාව තුළ, ඔබගේ ගම, නගරය, ජාතිය තුළ මෙම පෙළඹවීම හෝ පෙළඹවීමක් නොමැතිවීමට හේතුව කුමක්ද ... ? මේ ජාතිය තුළ ඇති දුෂ්කර තත්ත්වයෙන් නැවත හරවා අපගේ යාච්ඤාවට ප්‍රතිඵල ලබාදීමට දෙවියන් වහන්සේ ප්‍රමාණවත්ව සිටින බව මම තහවුරු කර සිටිමි. ඔබ එලෙස යාච්ඤා කරන අය අතරින් කෙනෙක් වෙනවාද ... ? මට ඔබ වෙනුවෙන් ඒ තීරණය ගැනීමට නුපුළුවන. ඔබ ඊළඟට කරන්නේ කුමක්දැයි දෙවියන් වහන්සේ බලාසිටින සේක. නැවත වාරයක් ඔබ දෙවියන් වහන්සේගේ සත්‍යතාවය අවබෝධ කර ගන්න. දෙවියන් වහන්සේව විශ්වාස කිරීම පිළිබඳව ඔබ ඊළඟට කරන්නේ කුමක්ද .. ? බොහෝ දේ අවදානමට ලක්වී ඇත. මනුෂ්‍යයා උදෙසා සදාකාලය තරාදියක එල්ලා තිබෙන අතර ඔබ එම තරාදිය අල්ලාගෙන (දරාගෙන) සිටින්නේය.

**"මාගේ දෙවියන් වහන්ස, ඔබගේ කැමැත්ත කරන්ට ප්‍රියවෙමි. එසේය, ඔබගේ ව්‍යවස්ථාව මාගේ සිතු තුළෙහි යයි කීමි" (ගීතාවලිය 40:8)**

# දෙවියන් වහන්සේට ළංවෙන්න එවිට උන්වහන්සේ ඔබට ළංවන සේක

ස්වාමීන් වහන්සේගේ ආශාව අපි උන්වහන්සේව දැනගෙන උන්වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයක් ඇතිව සිටීමයි. දෙවියන් වහන්සේ ආදම් සහ ඒව සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීමට සෙවූ බව උත්පත්ති පොතේ පැහැදිලිව දැකිය හැකිය. (උත්පත්ති 3:8-9) එළිදරව් පොතේ දී දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ සෙනඟ සමඟ සදාකාලයටම සිටිමින් ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන බව පොරොන්දු වී තිබෙන සේක. (එළිදරව් 21:3) උන්වහන්සේ සීමා රහිතව අපට ප්‍රේම කරන බව අවබෝධ කරදෙන අතර අපගේ මුළු හදවතින්, අපගේ මුළු ආත්මයෙන්, අපගේ මුළු බුද්ධියෙන්, අපගේ මුළු ශක්තියෙන් උන්වහන්සේට ප්‍රේම කරනවාට උන්වහ්නසේ කැමැත්තෙන් සිටින සේක. (මාර්ක් 12:30) උන්වහන්සේ අවසානය දක්වා අපේ ජීවිතවල ක්‍රියා කරමින් උන්වහ්නසේ සමග ගැඹුරු සම්බන්ධතාවයට ගෙන එන සේක. අපි මෙම සම්බන්ධතාවයෙන් මුලාවී ඈත්ව යන්නේ නම් අපි පසුතැවිලි වී උන්වහන්සේ වෙතට හැරී එන පිණිස උන්වහන්සේ අප තුළ ක්‍රියා කරන සේක.

දෙවියන් වහන්සේ සමඟ ගැඹුරු සම්බන්ධතාවයකට අපි සියලුදෙනා ලඟාවීමේ දෙවියන් වහන්සේගේ ප්‍රධාන අරමුණ සඳහා පෙරමඟ දූතයා මෙම කලාපයේ පණිවිඩ තුලින් හැකි වෙතැයි පෙරමඟ දූතයා කාර්යය මණ්ඩලයේ අපි විශ්වාස කරන්නෙමු. ඔබ මේ වන විටත් දෙවියන් වහන්සේ සමඟ සමීපව කටයුතු කරන්නේ නම්, උන්වහන්සේට එම සම්බන්ධතාවය තවත් තියුණු කිරීමට අවශ්‍යව තිබෙන සේක. ඔබට දෙවියන් වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයක් නොමැති නම් ඔබ පසුතැවිලිවී මුලු හදවතින්ම දෙවියන් වහන්සේව සෙවීමට ආරම්භ කිරීම උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක.

ඔබගේ වාතාවරණය දෙවියන් වහන්සේට සමීපව තිබෙන සම්බන්ධතාවයක් නොවේ නම්, ස්වාමීන් වහ්සේ ඔබට කරන කැඳවීම අනර්ඝ වූ තෑග්ගක් ලෙස සලකන්න. මක්නිසාද අපව පසුතැවිලිවීමට යොමු කරවන්නේ උන්වහන්සේගේ කරුණාවයි. (රෝම 2:4) අද දවසේ ඔබ උන්වහන්සේගේ හඬ අසන්නහු නම් ඔබගේ සිත දැඩිකර නොගන්න. (හෙබ්‍රෙව් 4:7) නමුත් ඔබගේ හදවත සම්පූර්ණයෙන්ම උන්වහන්සේට විවෘත කරන්න. අපගේ මුළු ආත්මයෙන් සහ මුළු හදවතින් අපි දෙවියන් වහන්සේව සොයන්නේ නම්, උන්වහන්සේ අපව මුණගැසෙන බව පොරොන්දු වූ පරිදි අපට මුණ ගැසෙනවා ඇත. (ද්විතිය කථාව 4:29)

## ස්වාමීන් වහන්සේ උදෙසා ආශාවෙන්න.

ස්වාමීන් වහන්සේ උදෙසා දාවිත් තුළ තිබුණා වූ සිත අප සියල්ලන්ට අනර්ඝ වූ ආදර්ශයකි. ස්වාමීන් වහන්සේ උදෙසා ඔහුට තිබුණා වූ දැඩි ආශාව දෙස සෝදිසියෙන් බලන්න. **"දෙවියන් වහන්ස, ඔබ මාගේ දෙවියන් වහන්සේය. අළුයම ඔබ සොයන්නෙමි. වතුර නැති වියැළුණු වෙහෙස උදවන්නා වූ දේශයකදී මාගේ ආත්මය ඔබ කෙරෙහි පිපාසා ඇත්තේය. මාගේ මාංසය ඔබ කෙරෙහි ආශා ඇත්තේය. මෙසේ ඔබගේ බලයත්, ඔබගේ මහිමයත් දකින පිණිස ශුද්ධස්ථානයේ දී ඔබ දෙස බලා සිටියෙමි."** (ගීතාවලිය 63:1-2) **"ස්වාමීන්ගෙන් එක දෙයක් ඉල්ලන්නෙමි. එනම්, ස්වාමීන්ගේ අලංකාරය දකින පිණිසත් උන්වහන්සේගේ මාළිගාවේ දී භාවනා කරන පිණිසත්, මාගේ ජීවිතයේ සියලු දවස්වලදී ස්වාමීන්ගේ ගෘහයෙහි වාසය කිරීමය. (ගීතාවලිය 27:4) මාගේ මුහුණ සොයව් යයි ඔබ කී කළ, ස්වාමිනි, ඔබගේ මුහුණ සොයන්නෙමියි මාගේ සිත ඔබට කීය."** (ගීතාවලිය 27:8)

ස්වාමීන් වහන්සේ සමඟ ඇති ඔහුගේ සම්බන්ධතාවයට ඔහුගේ පාපයට කළ හැකි බලපෑම ගැන දාවිත් සැලකිලිමත් වූ ආකාරය දෙස අවධානය යොමු කර බලන්න. **"ඔබට විරුද්ධව, ඔබට පමණක්ම විරුද්ධව පව් කළෙමි. ඔබගේ ඇස් හමුයෙහි නපුරුවට තිබෙන දේ කළෙමි. එබැවින් ඔබ කතාකරන කළ සාධාරණ සේක. විනිශ්චය කරන කළ ඔබ ශුද්ධ සේක."** (ගීතාවලිය 51:4) **"ඔබ ඉදිරියෙන් මා බැහැර නොකළ මැනව. ඔබගේ ශුද්ධාත්මය මාගෙන් පහ නොකළ මැනව. "**(ගීතාවලිය 51:11) දාවිත් සම්පූර්ණව සිටිය නිසා ස්වාමීන් වහන්සේ ඔහුව තෝරාගත්තා නොව, දෙවියන් වහන්සේගේ සිතට එකඟ වූ මනුෂයයෙක් නිසා දෙවියන් වහන්සේ ඔහව තෝරාගත් සේක. දාවිත් දෙවියන් වහන්සේට ප්‍රේම කළේය. උන්වහන්සේ සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීමට ආශා විය. ඔහු ස්වාමීන් වහන්සේගේ වචනයට, උන්වහන්සේගේ ක්‍රියා මාර්ගවලට ප්‍රේම කළ අතර, උන්වහන්සේව සතුටු කිරීමට අතිශයින් උනන්දු විය. බලාපොරොත්තු සුන් වූ වාතාවරණයන්වලදීත් ඔහු ස්වාමීන් වහන්සේ කෙරෙහි විශ්වාස කළේය. ඔහු ස්තුති ප්‍රශංසා කිරීමෙන් පූර්ණව සියලුම දේවලදී ස්වාමීන් වහ්නසේව මහිමයට පත්වනු දැකීමට ආශා විය.

## දෙවියන් වහන්සේට ළංවන විට

අප ස්වාමීන් වහන්සේ උදෙසා දැඩි උනන්දුවෙන් (ආශාවෙන්) සිටීමට උන්වහන්සේ ආශාවන්නේ අපගේ හදවත් සහ අවධානය වෙන කවදාටත් වඩා සම්පූර්ණයෙන්ම උන්වහන්සේ වෙතට හරවා ගැනීමටත් වන සේක. මෙයට ප්‍රධාන හේතුව උන්වහන්සේ අපව මවා තිබෙන්නේ උන්වහන්සේව දැන ගැනීමට සහ උන්වහන්සේ සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීමට වන සේක. උන්වහන්සේ සැබෑ වූ ජීවමාන දෙවියන් වහන්සේය.

**රිව් කාර්මයිකල් විසිනි**

අපි සියල්ලන්ටම, අපට ඇති සියල්ලට සහ උන්වහන්සේ වෙනුවෙන් අපට කළ හැකි සියල්ලට උන්වහන්සේ සුදුසුව සිටින සේක උන්වහන්සේට ප්‍රේම කිරීමට සහ උන්වහන්සේට නමස්කාර කිරීමට අපව මවා තිබෙන සේක.

එම නිසා අපි එය ඉටුකරන විට උන්වහන්සේ අපට ළංවන බව අනාවරණය කර ගැනීමට හැකි වේ. **"දෙවියන් වහන්සේට ළංවෙයල්ලා, එවිට උන්වහන්සේ නුඹලාට ළංවන සේක."** (යාකොබ් 4:8) දෙවියන් වහ්නසේ අපට සමීප වන විට සිදුවන්නේ කුමක්ද ... ? උන්වහන්සේගේ ප්‍රේමයෙන්, උන්වහන්සේගේ ජීවනයෙන් උන්වහන්සේගේ බලයෙන්, උන්වහන්සේගේ දයාවෙන්, උන්වහන්සේගේ චරිත ගුණාංග වලින් උන්වහන්සේගේ අනුකම්පාවෙන්, උන්වහන්සේගේ අභිප්‍රායෙන්, උන්වහන්සේගේ සත්‍යතාවයෙන්, උන්වහන්සේගේ ජයග්‍රහණයෙන් උන්වහන්සේගේ ශක්තියෙන්, උන්වහන්සේගේ බලාපොරොත්තුවෙන්, උන්වහන්සේගේ සමාදානයෙන් සහ ප්‍රීතියෙන් අපගේ ජීවිත ස්පර්ශ කරන සේක. උන්වහන්සේ මෙය ඉටුකරන විට අපගේ ජීවිතවලට ආශිර්වාද ලැබෙනවා පමණක් නොව අපි අනිත් අයට සේවය කරද්දී අපගේ ජීවිත වලින් උන්වහන්සේගේ ආශිර්වාදය ගලා යන්නේය. දෙවියන් වහන්සේට සියලු මහිමය වේවා.

අලුත් වසරක් ආරම්භ වී තිබෙද්දී ස්වාමීන් වහන්සේ සමඟ සම්බන්ධතාවයට සහ උන්වහන්සේ තුළ යාච්ඤා කිරීමට උන්වහන්සේගේ වචනයට අපගේ කාලය වඩා වැඩියෙන් කැප කිරීමට හැකිවේවා. මෙය අප උදෙසා උන්වහන්සේගේ හදවතේ ඇති කාරණය පමණක් නොව නමුත් අපගේ ජීවිතවලත්, අප වටා සිටින සියල්ලන්ගේ ජීවිතවලටත් මහත් වූ අවශ්‍යතාවය වන්නේය.

**"නුමුත් ඔබ කැළු ගොනාගේ අඟ වෙන් මාගේ අඟ උසස් කළ සේක. වව අලුත් තෙලින් ගාගෙන සිටිමි. මාගේ සතුරන් ගැන මාගේ ආශාව ඉෂ්ඨ වූ බව මාගේ ඇසට පෙනුනේය. මට විරුද්ධව නැගිටින්නා වූ නපුරුකම් කරන්නන් ගැන මාගේ ආශාව ඉෂ්ඨ වූ බව මාගේ කන්වලට ඇසුණේය. ධර්මිෂ්ඨයා තාල වෘක්ෂයක් වෙන් සශ්‍රීක වන්නේය. ඔහු ලෙබනොන් හි කිහිරි ගසක් වෙන් වැඩෙන්නේය. ස්වාමීන්ගේ ගෘහයෙහි හිඳුවනු ලද්දෝ අපේ දෙවියන් වහන්සේගේ විදුල්වල සවිලවන්නෝය. ස්වාමීන් වහන්සේ අවංක බවත්, මාගේ පර්වතය බවත්, උන්වහන්සේ තුළ කිසි අධර්මිෂ්ඨකමක් නැති බවත් පෙන්වන පිණිස ඔවුහු මහළු වයසේදීත් ඵලදෙමින් සාරවත් වන්නෝය. සශ්‍රීකවන්නෝය."** (ගීතාවලිය 92:1-15 )

# දෙවියන් වහන්සේගේ වචනය තුළින් උන්වහන්සේට මුණගැසීම

දෙවියන් වහන්සේගේ වචනය වන බයිබලය දෙවියන් වහන්සේගේ බලයේ අත්වාරමයි. බයිබලයේ අරමුණ දෙවියන් වහන්සේ වෙනුවට ආදේශ කිරීම නොවන බව මට පැහැදිලිවම ප්‍රකාශ කිරීමට අවශ්‍යව තිබේ. නුමුත් ඇත්තටම බයිබලයෙන් දෙවියන් වහන්සේගේ අභිමුඛත්වය ප්‍රකාශ කිරීම අප වෙතට ගෙන එන්නේය. අපි බයිබලය කියවා තිබෙනවා නම්, එසේ වුවත් අපට ජීවමාන වචනය හමුවෙලා නැතිනම් ඇත්තටම අපි බයිබලය කියවා නැත.

බයිබලයේ අපගේ කාලය ගැන කථා කරන්නේය. මක්නිසාද අපගේ කාලය පාපයේ ස්වභාවය කරුණුකොටගෙන මහත් වූ බලපෑමකට ලක්වී ඇත. බයිබලයේ කාර්යය මට හරිදේ කිරීමට පැවසීම පමණක් නොව නමුත් මම කරන්නා වූ වරදත් පෙන්වා දෙන සේක. මගේ ජීවිතයේ වැරදි දේ ගැන විනිශ්චයක් නොමැති නම් වර්ධනයවීමක් සිදු විය නොහැකිය.

## අපගේ ජීවිතවල දේව වචනයට ක්‍රියා කිරීමට ඉඩ හරිමු

මම අප ගැන නොකඩවා කරන තක්සේරුව නිර්දේශ නොකරන අතර දෙවියන් වහන්සේගේ වචනයට අප කැපවිය යුතු බව මම යෝජනා කරමි.

**ඒ.ඩබ්. ටොසර් විසිනි. 1897-1963**

ශුද්ධ ලියවිල්ලේ මෙහෙවර වන්නේ අපව සෝදිසි කිරීම සහ අපගේ ආත්මික නාඩි වැටීමේ නිරෝගීකම ස්ථාවර කිරීම හෝ තහවුරු කිරීම, නුසුදුසු යැයි ප්‍රකාශ කිරීම හෝ අනුකම්පා කිරීම, අනතුරු ඇඟවීම හෝ ධෛර්යමත් කිරීම වන්නේය. දේව වචනය සමඟ ප්‍රමාණවත් කාලයක් ගතකරන ලෙස මම යෝජනා කරන්නෙමි. සමහර විට අපි පුරුද්දට උදෑසන මෙනෙහි කිරීමේ දී කුඩා වේලාවක් ඒ සඳහා වැය කිරීමට වඩා වැඩි කාලයක් වැය කරන්න යනු මගේ යෝජනා කිරීම වන්නේය. දේව වචනය කියවීම සහ එය

4 පිටුවට

3 පිටුවෙන්

# දෙවියන් වහන්සේගේ වචනය...

සෝදිසියෙන් සොයා බැලීමට බොහෝ කාලයක් වැය කරන්න. අපගේ සියලුම වැඩ කටයුතු පසෙක දමා අපගේ දනින් හිඳ ශුද්ධාත්මයාණන් වහන්සේට අපට කථා කිරීමට මුළුමනින්ම ඉඩ හරිමු.

ඔබ දේව වචනය කියවද්දී දෙවියන් වහන්සේ සමඟ ඇති ඔබගේ සම්බන්ධතාවය වර්ධනය වන්නා වූ නිශ්චිත කාරණාත් ඉටු කිරීමට මම ඔබට ආරාධනා කරන්නෙමි. ඔබගේ ජීවිතයේ මූලික දේ ඔබම තක්සේරු කරන්න. මගේ හදවත තුළ කුමන ආකාරයක හෝ කැරළි ගැසීම පවතිනවාද ? කැරළි ගැසීම පේනකීමේ බරපතල පාපයට සමානකර පරණ ගිවිසුමේ සඳහන් කර තිබේ.

මෙය සැහැල්ලුවෙන් නොගෙන ඉතා ඕනෑකමින් ඔබගේ හදවතින් සෝදිසි කර බලන්න. ඔබගේ හදවත තුළ නොසලකා හරිනු ලැබූ කැරලි ගැසීම ස්වල්ප වශයෙන් හෝ පවතිනවාද ... ? යම් ආකාරයක කැරලි ගැසීමක් ඔබගේ හදවත තුළ තිබෙන බව සොයාගත්තේ නම් ඔබට ඒ සමඟ දැඩිව ක්‍රියාකරන්නට හැකි වේ.

අපි දෙවියන් වහන්සේගේ කැමැත්ත තුළ ජීවත් විය යුතුය. දෙවියන් වහන්සේගේ කැමැත්ත විශ්වයටම සුවය ගෙන එන්නේය. ස්වර්ගීය ඒකත්වයත්, සමාදානයක්, ගැලවීමත් ගෙන එන්නේය. දෙවියන් වහන්සේගේ කැමැත්ත ආලෝකය ලබාදෙයි. දෙවියන් වහන්සේගේ කැමැත්ත සදාචාරාත්මකව ජීවියෙකුට අවශ්‍ය සියල්ල වන අතර ඕනෑම දෙයකදී දෙවියන් වහන්සේගේ කැමැත්තට කුඩා දෙයකින් වුවත් බාධා කිරීම භයානක ප්‍රතිවිපාක ගෙන එනු ඇත. සැමවිටම දේව කැමැත්ත ඔබගේ ආරක්ෂාව බව මතක තබාගන්න. දෙවියන් වහන්සේගේ කැමැත්ත අවබෝධ කරගෙන එහි ශක්තිය තුළ ගමන් කරමින් සහ සර්ව බලධාරී දෙවියන් වහන්සේට විරුද්ධව මේ ලෝකයේ පවතින කැරලි ගැසීමෙන් ආරක්ෂා වෙමු. ඔබගේ සියලුම යාච්ඤාවන්, ඔබ විශ්වාසන්තව දේවස්ථානයේ කාර්යයන්වලට සම්බන්ධවීම ඔබගේ සියලු යහපත් වැඩ හැර වෙන කිසිවක් මෙයින් අදහස් කරන්නේ නැත. එයින් අපගේ ලැජ්ජා සහගත බිය සැඟවීම පිළිබඳව විශාල ලෙස කතා කරයි.

පරණ ගිවිසුම තුළ ඊශ්‍රායෙල් සෙනඟ කැරලිකාර මනුෂ්‍යයන් වූ අතර ඔවුන්ගේ විශ්වාසය දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ කැමැත්තට වඩා වෙනත් දේවල් කෙරෙහි වැරදි ලෙස තැබුවාය. ඊශ්‍රායෙල්වරුන්ගේ කථාව අපි දනිමු. වර්තමානයේ ඉවැන්ජලිස්ත සභාවන් ඊශ්‍රායෙල්ගේ වැරැද්දම කරමින් සහ අලුත් ගිවිසුමේ එරිසිවරුන්ගේ සහ සද්දුසිවරුන්ගේ තත්ත්වයට පත්ව සිටිති ඉවැන්ජලිස්ත සභාවල නායකයන් විශ්වාස කළ යුතු සත්‍යතාවයේ කාරණා දැන සිටිති. නමුත් කණගාටුදායක දේ ඔවුන් ඒ තුළ පවතින්නේ නැත. ඔබ දැන සිටින දේවල් තුළ ඔබගේ ගමන් කිරීම වෙනස්කර ගැනීමට ක්‍රියා කරන්නේ නැති නම් ඔබ දන්නා දෙයින් ප්‍රයෝජනයක් වන්නේ ද නැත.

## අපගේ කාලය තක්සේරු කර ගනිමු.

අපගේ කාලය තක්සේරු කරන්නේ කෙසේද ... ? අපි සිටින්නේ විශාල ප්‍රබෝධයක් (පිඹීමක්) තිබෙන කාලයක බව පැවසීමට මම කැමැත්තෙමි. මට ඒ ගැන සාක්ෂි දීලා කියන්න තිබුණා නම් හොඳයි කියලා මම සිතූ නමුත් මම බයිබලය ඉගැන්වීමට ඇති කාලය සමඟ සසඳා බලන විට කෙලින්ම සහ පැහැදිලිවම මට එය කියන්න නුපුළුවන. වර්තමාන කිතුණුවන් අතර ශුද්ධ ලියවිලිවල ඇති අනතුරු ඇඟවීම් සියල්ල ඉවත දමා ඇත. පොතකට පසුව පොතක් කිතුණුවන්ගේ සුභදායි පැත්ත සහ අනර්ඝ කාරණා පිළිබඳව මුද්‍රණය කර බෙදා හරිනු ලබති. අප තුළ ඇති වැරදි නොසලකා හැර ඇත්තෙමු. මම වෛද්‍යවරයෙකු වෙත ගිය විට ඔහු මගේ හිසට තට්ටු කර මා පුදුමාකාර පුද්ගලයෙක් බවත්, තව ටිකක් සතුටින් දේවල් ගත යුතු බවත් මට පැවසුවොත් මට නැවත එම වෛද්‍යවරයා වෙත යාමට අවශ්‍යය වනු ඇතැයි මම විශ්වාස නොකරමි. ඔහුට මා පිළිබඳව හරිදේ කුමක් ද කියා දැකීමට පුළුවන් වුවත් මගේ වරද කුමක්දැයි දැකීමට නොහැකි වී ඇත්නම් ඔහු මෙනාවගේ දොස්තර කෙනෙක්ද .. ?

අප පිළිබඳව හරි දේ කුමක්දැයි අප දැන ගැනීමට අපට අවශ්‍යව තිබෙන බව මම විශ්වාස කරමි. නමුත් අපගේ වරද පිළිබඳව බයිබලයේ පවසන්නා වූ දේත් කුමක්දැයි දැන ගැනීම අපට අවශ්‍යව තිබෙන බව් මම විශ්වාස කරමි. ඉන්පසු ඒ දේවල් පිළිබඳව යම් දෙයක් කළ යුතුය. අපි සැබෑ ලෙස අපගේ ජීවිත තක්සේරු කරන්නේ නම්, එම කාරණයේ දෙපැත්තම අපි දැන සිටීම අවශ්‍ය වේ.

වර්තමාන කිතුණුවන් මෙම කාරණයේ එක් පැත්තක් ගැන පමණක් කථා කරති. වැරැද්ද කුමක් ද යන්න සමඟ අපි කටයුතු කළ යුතුය. ඔබගේ වරද කුමක්දැයි අවබෝධ කර නොගෙන ඒ ගැන කටයුතු කළ නොහැකිය. දෙවියන් වහන්සේගේ වචනයෙන් ඉල්ලා සිටින්නේ කුමක්දැයි තේරුම් ගැනීම කරුණුකොටගෙන පමණක් වරද කුමක්දැයි පැහැදිලිව අවබෝධ කරගත හැකිය. දෙවියන් වහන්සේගේ වචනය මත පමණක් මම සියල්ලේ දී සිටගන්නෙමි.

දෙවියන් වහන්සේගේ සම්පූර්ණ උපදේශයට ඇහුම්කන්දී මේ අපගේ කාර්යය මත සිටීමට කැමති වන පිණිස මම වර්තමාන ඉවැන්ජලිස්ත සභාවන් උදෙසා ඉතා උද්යෝගයෙන් යාච්ඤා කරන්නමේ. අපි දෙවියන් වහන්සේගේ වචනයට ඇහුම්කන්දීමට අපගේ ජීවිත කැප කරන විට අපගේ ජීවිතවල විනිශ්චයට ලක්කර ගත යුතු අංශ අපි දැකීමට පටන් ගන්නෙමු. විනිශ්චය දෙවියන් වහන්සේගේ ගෘහයෙන් ආරම්භ වන බව ශුද්ධ ලියවිල්ලේ අවධාරණය කරයි. **"එක්නිසාද දෙවියන් වහන්සේගේ ගෘහයේ සිට විනිශ්චය පටන්ගන්න කාලය පැමිණ තිබේ. එය පළවුකොට අප ළඟ සිට පටන්ගත්තොත් දෙවියන් වහන්සේගේ සුභාරංචියට කීකරු නොවන්නන්ගේ අන්තිමය කුමක් වන්නේද ... ?"** (1පේ්‍රතුස් 4:17)

ඇමරිකාව තුළ ඉවැන්ජලිස්ත සභාව අවසාන පරම්පරාව හරහා පාපයට කැපවීම නිසා අපව පහලට ඇද වැටීම වර්ධනය වී ඇත. මෙම තක්සේරුවෙන් මම මගේ ජීවිතය බැහැර නොකරන්නෙමි. ඉවැන්ජලිස්ත කිතුණුවන් වශයෙන් අපි අතරේ පවතින පුද්ගලික සහ සාමූහික යන දෙඅංශයෙන්ම පාපය පිළිබඳව කටයුතු කළ යුතුය. පාපය ගැන බයිබලයේ පැහැදිලි කරන්නා වූ ස්ථානයට අපි නැවත පැමිණීම අවශ්‍යව තිබේ. දෙවියන් වහන්සේට විරුද්ධව කරන්නා වූ ඕනෑම කැරලි ගැසීමක් පාපය බව බයිබලයේ සඳහන්වේ. මේ දවස්වලදී කැරලි ගැසීම හොඳටම පවතිනවා ඇති කියා මම භයෙන් සිටිමි. කිතුණුවෙකුට ඊට සම්බන්ධවීම විශාල දෙයක් නොවේ. අපි අලස සහ මෘදු බවට පත්වී ඇත. එමෙන්ම අපි තමන් ගැනම සහතික වන කැරලිකාර සහ දැඩි පරම්පරාවක් බිහිකර ඇත්තෙමු.

අවසාන වර්ෂ කිහිපය තුළ කිතුණුවන් විනෝදාශ්වාදය ඉලක්ක කරගෙන ඇති බව පෙනෙන්නට තිබේ. අපි උත්සාහ කරන්නේ ලෝකය එහි ඇති තරඟයෙන්ම පරාජය කිරීමටය. අපි පරාජය වී ඇති අතර පරාජය වී ඇති බව අවබෝධ කරගන්නේ ද නැත.

දෙවියන් වහන්සේ වෙතට නැවත හැරීයාම අවශ්‍යව තිබෙනවා යැයි මගේ හදවත මොර ගසන්නේය. අපගේ නමස්කාර මෙහෙය තුළ නැවත දෙවියන් වහන්සේ වෙතට හැරී යා යුතුය. අපගේ නමස්කාර මෙහෙය නිරායාසයෙන්ම ආගමික විනෝදාශ්වාදය ගැන උත්සහ දැරීම නිසා මම විශ්මයට පත්ව සිටිමි. අපි අද දවසේ කරන්නා වූ සියලු දේවල් මධ්‍යයේ දෙවියන් වහන්සේ වෙතට හැරීයාම මට අවශ්‍යව තිබේ. අපි අපගේ ජීවිත තක්සේරු කර ගනිමින් දෙවියන් වහන්සේගේ වචනයේ සත්‍යතාවය සමඟ එකඟව කටයුතු කිරීම මැන බැලිය යුතුය.

දේව ධර්මය පමණක් ප්‍රමාණවත් නොවේ. මේ පරම්පරාවට තිබෙන දේවධර්ම පැහැදිලි කිරීම අනිත් පරම්පරාවලට තිබුණේ නැත. ඉතිහාසයේ වෙන කවදාටත් වඩා බයිබල් විද්‍යාල, සෙමනේරි මේ පරම්පරාවට තිබේ. අපි දේවධර්මය දනිමු. අපට දේවධර්මය උපුටා දැක්වීමට පුළුවන. ප්‍රශ්නය වී තිබෙන්නේ අපගේ දේවධර්මය ශ්‍රාස්ත්‍රීය කාරණාවලට නැඹුරු වී තිබීමයි. දේවධර්මය අපගේ කිතුණු ජීවිතයේ උපාංගයක් පමණි. දේවධර්මය දෙවියන් වහන්සේ වෙතට ඔවුන්ව මෙහෙයවන්නේ නැති බව මනුෂ්‍යයන් සොයාගෙන ඇත. එය අපව දෙවියන් වහන්සේ වෙතට මෙහෙයවන්නේ නැති නම් එහි ඇති වටිනාකම කුමක්ද .. ? අපි දරන ධර්මය අපව දෙවියන් වහන්සේ ඉදිරියට ගෙන නොයන්නේ නම් සැබවින්ම එය අපට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද .. ?

දැල්වෙන්නා වූ හදවතේ සහයෝගීතාවයේ කොටස්කරුවෙකුවීමට මට අවශ්‍යව තිබේ. මට මගේ ජීවිතය තක්සේරු කරගෙන සැගවී තිබෙන අනවශ්‍ය දේ උගුලා දමා සර්ව බලධාරී දෙවියන් වහන්සේව මට අවශ්‍යව තිබේ. දෙවියන් වහන්සේ මගේ ජීවිතයේ කේන්ද්‍රස්ථානය ලෙස සකස් කර ගැනීමට මට අවශ්‍යව තිබේ. ඔබගේ ආත්මික ජීවිතය තක්සේරු කර ගැනීමට මම ඔබට ආරාධනා කරමි. බයිබලයේ සියුම් සෝදිසි කිරීමට එය ඔරොත්තු දී සිටිනවාද .... ?

## අපි එකිනෙකා කළ යුතු තෝරාගැනීම

අපගේ ජීවිත විප්ලවීය ලෙස විනිශ්චය කිරීමට අපි බයිබලයට ඉඩදිය යුතුය. දෙවියන් වහන්සේගේ අබිමුඛත්වය ප්‍රකාශවීම තුළට ඔබව ගෙන එමින් දෙවියන් වහන්සේට විරුද්ධව ඇති කාරණා වලින් ඔබව වෙන්කරන්නේද .. ? බොහෝ දෙනා මෙම ආරාධනය පිළිගන්නේ නැත. ඔබගේ ජීවිතයේ කුඩාම දේ දක්වා බයිබලයේ කථා කරන්නේය. මේ අවාසන දවස්වලදී ඇදහිලිවන්තයන් සේ සුළු පිරිසක් පමණක් මෙම ආරාධනාව පිළිගෙන ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කරන බව මම විශ්වාස කරමි. **"එකල ඔහු වට උත්තර දෙවින් සෙරුබ්බාබෙල්ට ස්වාමීන් වහන්සේගේ වචනය වේය, එනම්, බලයෙන්වත්, ශක්තියෙන්වත් නොව, මාගේ ආත්මයෙන් යයි සේනාවල ස්වාමීන් වහන්සේ කියන සේක."** (සෙකරියා 4:6)

# සැබෑ සභාව

සභාවෙන් පිටත ගැලවීමක් නොමැති නිසා ඔබ සැබෑ සභාවට අයිතිව සිටීම මට අවශ්‍යව තිබේ. ඔබ ඉරිදා යන්නේ කොයි සභාවටද කියා අහන්න මට අවශ්‍ය නොවේ. මට අවශ්‍යය ඔබ සැබෑ සභාවට අයිතිව සිටිනවාද කියා පමණි. මේ සැබෑ සභාව තිබෙන්නේ කොහේද...? සැබෑ සභාව කොයි වගේ ද...? සැබෑ සභාව හඳුනාගත හැකි ලකුණු මොනවාද...? ඔබ මෙවැනි ප්‍රශ්න ඇසිය හැකිය. ඔබ මා වෙතට අවධානය යොමු කරන්න මම ඔබ සමඟ සමහර පිළිතුරු බෙදා ගන්නෙමි.

## සැබෑ සභාව සියලුම ඇදහිලිවන්තයන් ස්වාමී වූ යේසුස් වහන්සේ තුළ සෑදුනාවූ අයයි.

එය සෑදී ඇත්තේ දෙවියන් වහන්සේ විසින් තෝරාගනු ලැබූ පුරුෂයන් සහ කාන්තාවන්ගෙනි. පිය වූ දෙවියන් වහන්සේගේ තෝරා ගැනීමත්, පුත්‍ර වූ දෙවියන් වහන්සේගේ ලේ ඉසීමත්. ශුද්ධාත්ම වූ දෙවියන් වහන්සේගේ විශුද්ධ කිරීමේ ක්‍රියාවක් අපි පැහැදිලිවම යම් කෙනෙක් තුළ දකිනවා නම්, ඒ පුද්ගලයා සැබෑ ක්‍රිස්තුස් වහන්සේගේ සභාවේ සාමාජිකයෙක් බව අපි දකින්නෙමු.

## සැබෑ සභාවේ සියලුම සාමාජිකයන් තුළ එකම ආකාරයේ ලක්ෂණ දැකිය යුතුය.

ඔවුන් සියලුදෙනාම ආත්මයෙන් නැවත උත්පාදනය වී ඇත. ඔවුන් සියලුදෙනාම, **"දෙවියන් වහන්සේ කෙරෙහි පසුතැවිල්ලත්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලත් ...."** (ක්‍රියා 20:21) හිමිකරගෙන සිටින්නෝය. එමෙන්ම ශුද්ධ වූ ජීවිතයක් සහ සන්නිවේදන සම්බන්ධතාවක් ඇතිව සිටින්නෝය. ඔවුන් සියලුදෙනා පාපයට විරුද්ධව සිට ක්‍රිස්තුස් වහන්සේට ප්‍රේම කරන්නෝය. ඔවුන් විවිධ වූ ආකාරයෙන් නමස්කාර කරන නමුත් ඔවුන් සියලුදෙනාම එක සිතක් ඇතිව සිටින්නෝය. ඔවුන් සියලුදෙනාම ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන ගෙන යනු ලබන්නෝය. ඔවුන් සියල්ලන්වම එක අත්තිවාරමක් මත ගොඩනගා ඇත. ඔවුන් එකම ආගමික පොතක් වෙත එනම්, ශුද්ධ වූ බයිබලය වෙත ඇදී ගොස් ඇත. ඔවුන් සියලුදෙනාම යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙත කේන්ද්‍ර වී ඇත. ඔවුන් සියල්ලන්ටම එක හදවතින් හාලේලූයියා කියා පැවසීමට පුළුවන. එක සිතකින් සහ එක හඬකින් ආමේන් ..... !ආමේන් ...! කියා ප්‍රතිචාරය දැක්වීමට පුළුවන.

## සැබෑ සභාව පොළොවේ මෙහෙකරුවන් මත රැඳී පවතින්නේ නැත.

සැබෑ සභාවේ සාමාජිකයන්ට පොළොවේ මෙහෙකරුවන් කවුරු ඉතා වටිනා ලෙස සුභාරංචිය දේශනා කලත් එහි හිස, එහි එඩේරා සහ එහි ප්‍රධාන බිෂොප්වරයා යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පමණි. දේවසේවකයන්ට දොරටුව පෙන්විය හැකි වුවත් යේසුස් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ පමණක් සාමාජිකයන්ව ඇතුල් කරගන්නා සේක. උන්වහන්සේ දොර විවෘත කරන තෙක් පොළොවේ කිසිදු මනුෂ්‍යයෙකුට එහි දොර විවෘත කළ නොහැකි වේ. බිෂොප්වරයෙකුටවත්, දොරටුව විවෘත කළ නොහැකිය. වරක් සුභාරංචිය පිළිගෙන පසුතැවැලිවීමට ඉඩ හැරියා වූ අය මෙම සැබෑ සභාවේ සාමාජිකයන්වේ.

## සැබෑ සභාවේ පැවැත්ම කිසියම් දෙයක් මත රඳා පවතින්නේ නැත.

ආගමික උත්සව, දෙව් මැදුරු, දේශනා කූඩු, භෞතිස්ම ටැංකි , පූජක ඇඳුම්, සංගීත භාණ්ඩ, පරිත්‍යාගයන්, මුදල්, රජවරු, ආණ්ඩු නඩුකාරයන් හෝ මනුෂ්‍යයන්ගෙන් අත්වලින් කරන කිසිදු ආකාරයේ ක්‍රියාවක් මත සැබෑ සභාව රඳා පවතින්නේ නැත. ඉහත කී සියලුම දේ අයින් කළත් සැබෑ සභාව පවතින්නේය. සැබෑ සභාව කාන්තායරක හෝ ගුහාවක හෝ පොළොවේ ලෙනක වුවත් සාර්ථකව පැවතිය හැකිය. එය වෙන කිසි දෙයක් මත නොව ක්‍රිස්තුස් වහන්සේගේ අභිමුඛත්වය සහ උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ මත පවතින අතර උන්වහන්සේම සභාව ආරම්භ කළ නිසා සභාව මරණයට පත්වන්නේ ද නැත.

## වර්තමාන ගෞරවය සහ වරප්‍රසාද පිළිබඳ ශුද්ධ ලියවිලි පද මාතෘකා සහ අනාගත මහිමය පිළිබඳ පොරොන්දු විශේෂයෙන් අයත් වන්නේ මෙම සැබෑ සභාවටයි.

මෙය ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයයි. මෙය ක්‍රිස්තුස් වහන්සේ රැළයි. මෙය දෙවියන් වහන්සේගේ පවුලේ සහ ඇදහිල්ලේ නිවසේ අයයි. එය ගොඩනගන්නේ දෙවියන් වහන්සේය. මෙය දෙවියන් වහන්සේගේ අත්තිවාරම සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ මාළිගාවයි. මෙය ප්‍රථම ඵල වන ස්වර්ගයේ නම් ලියා තිබෙන්නා වූ අයයි. ඔවුන් රාජකීය පූජකයන් තෝරාගත් සෙනඟ සහ විශේෂ සෙනගකි. මිලදී ගන්නා ලද සෙනඟ සිටින දෙවියන් වහන්සේගේ වාසස්ථානයයි. ඔවුන් ලෝකයේ ආලෝකය සහ පොළොවේ ලුණුය. මෙම ශුද්ධ වූ සභාව අපෝස්තුළුවරුන් මෙන් ඇදහිල්ලෙන් ක්‍රිස්තුස් වහන්සේගේ පොරොන්දු තුළත් සිටින්නෝය. **"මම නුඹට කියමි. නුඹ ප්‍රේතුස්ය. තවද මේ පර්වතය පිට මාගේ සභාව ගොඩ නගන්නෙමි. පාතාලයේ දොරටු එක පරාජය නොකරන්නේය."** (මතෙව් 16:18) **"මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්නට ඔවුන්ට උගන්වාපල්ලා, මම ද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමියි කී සේක."** (මතෙව් 28:20)

## මෙම සැබෑ සභාව තුළ පමණක් සැබෑ එක්සත්කම පවතින්නේය.

එම සාමාජිකයන් කිතු දහමේ සියලු බෑරුම් කාරණා සමඟවේ. මන්ද ඔවුන් එක ආත්මයක් කරුණුකොටගෙන උගන්වනු ලබනවා ඇත. ඔවුන් දෙවියන් වහන්සේ පිළිබඳව, යේසුස් වහන්සේ පිළිබඳව ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳව, පාපය, ඔවුන්ගේ හදවත් ඇදහිල්ල, පසුතැවිලිවීම සහ ශුද්ධකමේ අවශ්‍යතාවය, බයිබලයේ වටිනාකම, යාච්ඤා කිරීමේ වැදගත්කම පැමිණෙන්නට තිබෙන නැවත නැගිටීම සහ පැමිණෙන්නාවූ විනිශ්චය ආදි කාරණා පිබඳව එක අදහසකින් යුතුව සිටින්නෝය. ඔවුන් දෙදෙනක් හෝ තුන්දෙනෙක් පොළොවේ කෙළවරේ කොන්වල සිට වෙන වෙනම සෝදිසි කළත් මෙම කරුණු සියල්ල මත ඔවුන් එකම ස්වරූපයක් ඇතිව සිටින බව සොයාගත හැකිය.

## මෙම සභාව තුළ පමණක් සැබෑ ශුද්ධකම පවතින්නේය.

එහි සියලු සාමාජිකයන් ශුද්ධව සිටිති. ඔවුන් යාන්තමින් ශුද්ධව සිටිනවා නොව සමස්ත වශයෙන්ම ඔවුන් ශුද්ධව සිටිති. ශුද්ධකමේ නාමය තුළ සානුකම්පාව ඇතිව ශුද්ධව සිටියි. ඔවුන් සියලුදෙනාම ක්‍රියාවෙන් සැබෑකමින්, ජීවිතයෙන්, සත්‍යතාවයෙන් ශුද්ධව සිටිති. ඔවුන් සියලුදෙනාම අඩු වහයෙන් හෝ වැඩි වශයෙන් යේසුස් වහන්සේගේ ස්වරූපය ගනු ලබන්නෝය. ශුද්ධකමට ප්‍රතිවිරුද්ධව සිටින කිසිවෙක් මෙම සභාව තුළ සිටින්නේ නැත. මෙහි සිටින්නේ සැබෑ කිතුණුවන් පමණි. එය එක ජාතියක හෝ එක මනුෂ්‍යය කොට්ඨාශයකගේ සභාවක් නොවේ. එහි

**ජෙසී රයිලි (1816-1900) විසිනි.**

සාමාජිකයන් ලෝකයේ කොතැනක හෝ සිට සුභාරංචිය පිළිගෙන එය අදහන්නා වූ අයයි. එය එක් රටකට හෝ එක් රාජ්‍යයකට සීමා කළ නොහැකිය. සියලු භාෂාවන් කථා කරන මනුෂ්‍යයන් සිටින සතර දිශාවේම අයගෙන් සැදුම්ලත් සභාවයි. නමුත් ඔවුන් සියලුදෙනාම යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ එක්ව සිටියි.

සැබෑ අපෝස්තුළුවරුන්ගෙන් සෑදුනු සභාව මෙයයි. එය ගොඩනැගී ඇත්තේ අපෝස්තුළුවරුන් තැබූ අත්තිවාරම මතයි. එමෙන්ම ඔවුන් දේශනා කළා වූ දේවධර්මය මත රැඳී තිබේ. එහි සාමාජිකයන්ගේ ඉලක්කය ප්‍රධාන කාරණා දෙකක් මත පවතියි. එනම් අපෝස්තුළුවරුන්ගේ ඇදහිල්ල සහ අපෝස්තුළුවරුන්ගේ ප්‍රායෝගික ක්‍රියා කිරීමයි. මේ කාරණා දෙක නොමැතිව අපෝස්තුළුවරුන් අනුගමනය කිරීමට කතා කරන පුද්ගලයා පිත්තල සහ ගිගුරුම් දෙන අත්තලකට වඩා හොඳ නැතැයි ඔවුහු සලකති.

## මෙම සභාව නිශ්චිතවම අවසානය දක්වා දරා සිටින්නා වූ සභාවයි.

කිසිදෙයකට ඔවුන්ව පරාජය කිරීමට හෝ විනාශ කිරීමට නුපුළුවන. එහි සිමාජිකයන්ව පීඩාවට ලක් කරනු ලැබූවත්, අසාධාරණයට ලක්වුවත්, හිරගෙදර දැමූවත්, පහර දෙනු ලැබූවත්, හිසගසා දැමූවත්, ගින්නට දැමූවත්, සැබෑ සභාව සහ මුලින්ම විනාශකර දැමිය නොහැකිය. ඔවුන් ඒ පීඩාවලින් නැවත නැගිටින්නෝය. ජල මැදින් සහ ගිනි මැදින් ගමන්කර ජීවත් වන්නෝය. එක් ස්ථානයකදී එය පොඩි කිරීමට ලක් වූ විට තවත් ස්ථානයක හට ගන්නේය. පාරාවෝ, හෙරෝද්, නීරෝ වැනි අය මේ සභාවේ ලේ බිම වැගිරවීම නිශ්ඵල විය. ඔවුන්ගෙන් දහදහස් ගණන් දෙනා කෲර ලෙස මරනු ලැබුවත් ඔවුන් තමුන්ගේ සදාකාලික ආශිර්වාදයට ඇතුල් වූවෝය. සැබෑ සභාවේ ඔවුන් සියල්ලන්ම සදාකාලයටම ජීවත් වන අතර ඔවුන්ගේ වාරය පැමිණෙන තෙක් තැන්පත් කර තිබෙනවා දැකිය හැකිය. එය මේ ලෝකයේ බොහෝ මිටි කඩා දැමූ කිනිහිරයක් වන අතර තවමත් බොහෝ මිටි බිඳ දමමින් සිටියි. එය නිතරම ඇවිලෙන්නා වූ පඳුරක් වන අතර කිසිසේත් දැවී අවසන් වන්නේ නැත.

මෙය පොළොව මත ක්‍රිස්තුස් වහන්සේගේ කාර්යය ඉටුකරන්නා වූ සභාවයි. එහි සාමාජිකයන් කුඩා රැළක් වුවත් මේ ලෝකයේ සෙනඟ සමඟ සන්සන්දනය කිරීමේ දී ඉතා සුළු ප්‍රමාණයක් වුවත් මුළු විශ්වයම සෙලවීමට ඔවුන්ට හැකිය. ඔවුන්ගේ යාච්ඤාව කරුණුකොටගෙන රාජ්‍යයන් වෙනස් කරනු ලබන්නෝය. නිර්මල සහ නොකිලිටි දහම පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීමේ ක්‍රියාකාරී සේවකයෝ මොවුන්ය. මොවුන් රටක ජීව රුධිරය, පළිහ වන්නේය. ආරක්ෂාවේ රැඳී පැවතීමට ඔවුන් අයත්ව සිටින ඕනෑම ජාතියකට සහය වන්නේය.

සැබෑ සභාව අවසානයේ දී සැබවින්ම මහිමයට පැමිණෙන්නේය. මේ ලෝකයේ සියලුම මහිමය පහව යන විට සැබෑ සභාව ස්වර්ගීය දෙවිපියාණන් වහන්සේගේ සිංහාසනය ඉදිරිපිට කැළලක්වත්, පළුද්දක්වත් නැතිව පෙනී සිටින්නෝය. පොළොවේ සිංහාසන, ආඥාවන්, බලය කිසිත් නැතිකමට පත්වන්නේය. පොළොවේ ගෞරවය සහ උරුමය පහව යන්නෝය. නමුත් සැබෑ සභාව ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රකාශවීමේ දවසේ දී පියාණන් වහන්සේගේ සිංහාසනය ඉදිරියේ ප්‍රීතියෙන් සිටින්නෝය.

# ක්‍රිස්තුස් වහන්සේගේ මහත් වූ ආයාචනාවන් (ඉල්ලීම්) තුනක්

2017 අප්‍රේල් මාසයේ කලාපයට අයත් ප්‍රකාශයට පත් නොවූ ලිපියකි.

ජෙසී රයිලි විසිනි.

**"සත්‍යතාවයෙන් ඔවුන් පවිත්‍ර කළ මැනව, ඔබගේ වචනය සත්‍යතාවය, ඔබ මා ලෝකයට එවුවාක් මෙන්ම වම ද ඔවුන් ලෝකයට යැව්වී. සත්‍යතාවයෙන් ඔවුන්ද පවිත්‍රවන පිණිස ඔවුන් උදෙසා මා කැපකර ගනිමි."** (යොහාන් 17:17-19)

**"මොවුන් ගැන පමණක් නොව, මොවුන්ගේ වචනය කරුණු කොටගෙන මා කෙරෙහි විශ්වාස කරන්නවුන් ගැනත්, ඔවුන් සියල්ලන් ඒකත්වයක් වන පිණිස පියවූ ඔබ මා තුළෙහිද මා ඔබ තුළෙහිද සිටින්නාක් මෙන්ම ඔබ මා එවූ බව ලෝකයා විශ්වාසකරන පිණිසත් අප තුළ ඔවුන් ඒකත්වයක් වන පිණිස, යාච්ඤා කරමි. අප ඒකත්වයක්ව සිටින්නාසේම ඔවුනුත් ඒකත්වයක් වන පිණිස ඔබ වට දුන් මහිමය ඔවුන්ට දුනිමි. මෙසේ කල්හි මා ඔවුන් තුළෙහිද, ඔබ මා තුළෙහිද සිටීමෙන් ඔවුන් ඒකත්වයට සම්පූර්ණ ලෙස පැමිණෙන පිණිසත් ඔබ මා එවූ බවද වට ප්‍රේම කළාක් මෙන් ඔවුන්ටත් ප්‍රේම කළ බවද ලෝකයා දැනගන්නා පිණිසත්ය. "** (යොහාන් 17:20-23)

**"පියාණෙනි, ඔබ වට දුන් මහිමය ඔබ වට දුන්නාවුන් විසිනුත් දක්වන පිණිස මා සිටින තැන ඔවුනුත් මා සමඟ සිටිනවාට කැමැත්තෙමි. එක්නිසාද ලෝකය මැවීමට පළමුවෙන් ඔබ වට ප්‍රේමකළ සේක. ධර්මිෂ්ඨ පියාණෙනි, ලෝකයා ඔබ හඳුනන්නේ නැත.. නමුත් මම ඔබ හඳුන්නෙමි. මොවුහුද ඔබ විසින් මා එවූ බව දැනගෙන්තෝය. ඔබ මා කෙරෙහි ඇතුව සිටි ප්‍රේමය ඔවුන් තුළෙහි ද, මාත් ඔවුන් තුළෙහිද වන පිණිස ඔබගේ නාමය ඔවුන්ට දැනැවිමි. තවත් දන්වන්නෙමියි කී සේක."** (යොහාන් 17:24-26 )

මෙම අපූරු බයිබල් පද වලින් ස්වාමීන් වහන්සේ පොළොවේදී කරන ලද අතිශය පුදුමාකාරවූ යාච්ඤා කිරීම් නිමාවකට පැමිණීම උචිත වූයේය. ප්‍රථමයෙන් උන්වහන්සේගේ අවසාන රාත්‍රී භෝජනය ගෙන ඉන්පසුව ස්වාමීන් වහන්සේ මෙම අවසාන යාච්ඤා ඉල්ලීම් පියාණන් වහන්සේගෙන් ඇයද සිටි සේක. අපගේ ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ ගෝලයන් වෙනුවෙන් ඉතා වැදගත් වූ කාරණා තුනක් පිළිබඳව ආයාචනා කළ සේක.

## පවිත්‍ර කිරීම

යේසුස් වහන්සේ උන්වහන්සේගේ සෙනඟව පවිත්‍ර කිරීම උදෙසා යාච්ඤා කරන්නේ කෙසේදැයි අපි ප්‍රථමයෙන් අවධානයට ලක් කළ යුතුය. **"ඔවුන් පවිත්‍ර කළ මැනව..." "සත්‍යතාවයෙන්"** එය කරන සේක්වා කියා උන්වහන්සේ පැවසූ සේක. **"ඔබගේ වචනය සත්‍යතාවයයි "**

මේ කොහොම උනත් "ඔවුන්ව පවිත්‍රකළ මැනව" යන වචනයෙන් නිසැකවම අදහස් කරන්නේ ඔවුන්ව ශුද්ධකමට පමුණුව මැනව කියවන සේක. එහිදී උන්වහන්සේගේ සෙනඟගේ වචන තුළ, සිතුවිලි තුළ, කියාවන් තුළ, ජීවිතය තුළ, චරිත ගුණාංග තුළ වඩා ශුද්ධකමට පමුණුවනු ලබන පිනිස, වඩා ආත්මික වන පිණිස වඩා පවිත්‍ර වන පිණිස පියාණන් වහන්සේට යාච්ඤා කළ සේක. ගෝලයන්ට මේ වන විටත් කරුණාව තුළින් සමහර දේවල් ඉටු වී තිබේ. ඔවුන්ගේ කැදවීම, පරිවර්තනය කරනු ලැබීම, අලුත් කරනු ලැබීම, වෙනස් කරනු ලැබීම සිදුවී ඇත. සභාවේ උතුම් වූ හිස වන යේසුස් වහන්සේ උන්වහන්සේගේ සෙනඟව කාරුණාවේ ක්‍රියාවලින් උසස් ලෙස ඔසවාගෙන යාම වැඩි දියුණු කිරීම වඩා සම්පූර්ණ ලෙස පවිත්‍ර කරනු ලැබීම සහ ආත්මිකව, ශාරීරිකව, මානසිකව, ශුද්ධකම තුළ නිර්මාණය කරනු ලැබීමෙන් සෑම අංශයකින්ම තමන්වහන්සේ මෙන් වන පිණිස යාච්ඤා කළ සේක. .

මෙම යාච්ඤා කිරීමේ ප්‍රඥාව නිශ්චිතවම සම කළ නොහැකි බව පවසමින් අපි එය පෙන්වාදීම අවශ්‍ය නොවේ. ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙකරුවන් සෑම කාරණයකින්ම වඩා ශුද්ධව සිටීම උන්වහන්සේගේ ආශාව වන සේක. ශුද්ධව ජීවත්වීම කිතුණුවන් තුළ සැබවින්ම මහත් ලෙස තහවුරු වන්නේය. මනුෂ්‍යයන් අපගේ සත්‍ය වූ තර්කය ප්‍රතික්ෂේප කරනවා විය හැකිය. නමුත් ඔවුන්ට අපගේ දේව භක්තික ජීවිතයේ සාක්ෂිය මගහැරීමට (වැළැක්වීමට) නුපුළුවන. එවැනි ජීවිතයක් දේව වචනය කරුණු කොටගෙන මිස ආගමිකව සරසා එය අලංකාර ලෙස නිර්මාණය කර ජය ගැනීමට නොහැකිය.

යම් කෙනෙක් මුහුණ දෙන්නා වූ එවැනි කාරණා තුළ යේසුස් වහන්සේ අයැදි සිටින ප්‍රථම කාරණය ලෙස පවිත්‍ර කරනු ලැබීමේ අනර්ඝ වූ අවශ්‍යතාවය වර්දනය වන්නේද .. ? යම් කෙනෙක් දෙවියන් වහන්සේගේ ශුද්ධකමේ ප්‍රීතිය අවබෝධ කර ගැනීමට අපොහාසත්වී සැබවින්ම දෙවියන් වහන්සේගේ අධික සැනසිල්ල ඇතිව උන්වහන්සේට සමීපව සහ සැමවිටම උන්වහන්සේ සමඟ ගමන් කිරීමට හැකිද .... ? මෙම කාරණයේ දී නිශ්ඵල වචන තුළ අපව රැවටීමට (මුලා කිරීමට) කිසි මනුෂ්‍යයෙකුට ඉඩහරින්නේ නැත. යම් කෙනෙක් ශුද්ධකමට නිග්‍රහ කර, යහපත් කාර්යයන් අතපසු කර අහංකාර ලෙස රැවටීම යටතේ සිටින විට ඇදහිල්ල කරුණුකොටගෙන ලැබෙන පවිත්‍රවීමට ගෞරව කිරීම හැකිවන්නේ නැත. එමෙන්ම ඔහු තුළ පැහැදිලිවම ක්‍රිස්තුස් වහන්සේගේ මනස පෙනේනට නැත.

## ඒකත්වය

මේ පදවල දෙවනුව යේසුස් වහන්සේ උන්වහන්සේගේ සෙනඟ එක්සත්ව, එකත්වයක් ඇතිව සිටින පිණිස යාච්ඤා කළේ කෙසේදැයි සඳහන් කර තිබේ. **"ඔවුන් සියල්ලන් ඒකත්වයක් වන පිණිස .." "අප තුළ ඔවුන් එක්තවයක් වන පිණිසත් ..." "අප ඒකත්වයක්ව සිටින්නාසේම ඔවුනුත් ඒකත්වයක් වන පිණිස.."** සහ **"ඔබ මා එවූ බව ලෝකයා විශ්වාසකරන පිණිසත් ... "ඔබ මා එවූ බවද ... ලෝකයා දැනගන්නා පිණිසත්ය."** අපගේ ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ පියාණන් වහන්සේගෙන් ආයාචනා කර ඉල්ලුවා වූ මෙම කාරණා තුනේ ප්‍රමුඛත්වය ගත්තා වූ කාරණය මෙයයි.

කිතුණුවන් අතරේ එක්සත්කමේ වටිනාකම ශක්තිමත්ව තහවුරු කිරීමට නොහැකි අතර පාපයෙන් පූර්ණව බෙදී සිටින බව පැවසීය හැකිය. මෙම බයිබල් ඡේදය තුළ අපගේ ස්වාමීන් වහන්සේ මේ වැදගත් වූ කාරණය සඳහා වැඩියෙන් අවධානය යොමු කර තිබෙන සේක. ක්‍රිස්තුස් වහන්සේගේ සභාව වශයෙන් දුර්වලවීම සහ ආගමිකව අපකීර්තියට පත්වන ලෙස සෑම කාලයේදීම කිතුණුවන් බෙදී සිටීම කොපමණ වේදනාකාරී සත්‍යතායක් ද ... ? පාපයට සහ සාතන්ට විරුද්ධව සටන්වදිනවා වෙනුවට කිතුනුවන් නිතරම ඔවුන්ගේ සහෝදරයන්ට විරුද්ධව සටන්වැදීම තුළ කොමපණ නිශ්ඵලයේ ශක්තිය වැයකර තිබෙනවාද ... ? ඔබගේ ඇතුළත තිබෙන ආරවුල් හරිගස්වාගන්න. එවිට අපි විශ්වාස කරන්නම් කියා ලෝකයේ අයට පැවසීමට දේව දරුවන් නැවත, නැවත, ඉඩහැර තිබෙන්නේ කෙසේද .. ? ස්වාමී වූ යේසුස් වහන්සේ උන්වහන්සේගේ අනාගත වාක්‍යමය දෑස් වලින් මේ සියලු දේ කලින් දුටු බව සැකයක් නැතිව අපි දැනගත යුතුය. අනාගතයේ සිදුවන්නට යන්නා වූ දේ උන්වහන්සේ දුටු නිසා ඇදහිලිවන්තයන් උන්වහ්නසේ සමඟ උද්යෝගිතමත්ව ඒකත්වයක් ඇතිව සිටින පිණිස යාච්ඤා කළ සේක.

අපගේ මනස තුළ ක්‍රිස්තුස් වහන්සේගේ යාච්ඤාවේ තිබූ මේ පංගුකාරත්වය පවතින පිණිස සහ අපගේ කිතුණු හැසිරීම තුළ බලපෑමක් ඇතිවන ලෙස නිරන්තරයෙන් මෙය භාවිතා කිරීමටත් ඉඩහරිමු. කිසිවෙකුට මෙය සුළුවෙන් සිතීමයට හෝ සමහර මනුෂ්‍යයන්ට එලෙස හැගෙන්නට සලස්වන ලෙස ක්‍රියා කිරීමට, නිකාය භේද ඇතිවීමට ඉඩනොහරින්න. නිකායක, කණ්ඩායමක, සංවිධානයක වර්තමානයේ කුඩාවට තිබෙන මේ කාරණය වර්ධනය වනු ඇත. මේ කාරණා තුළ රදා සිටීම හැම අතින්ම සාතන්ට උපකාරයක් සහ ක්‍රිස්තුස් වහන්සේගේ සභාවට හානියක් පමණක් වේ. **"කාටවත් නපුර්ට නපුර නොකර්පල්ලා. සියලු මනුෂ්‍යයන් ඉදිරියේ ශෝභන දේ කරන්ට සිතට ගනිල්ලා. පුළුවන් නම් නුඹලාගෙන් විය හැකි ප්‍රමානයටම සියලු මනුෂ්‍යයන් සමඟ සමාදානයෙන් සිටපල්ලා "** (රෝම 12:17-18) කොටස්වලට කැඩීයාමට සහ බෙදීමට ප්‍රථමයෙන් දරා ගැනීමට, සතුරාට ජයග්‍රහණය ලබා නොදීමට වඩා වැඩියෙන් ඉවසීමට කටයුතු කරමු. කිතුනුවන් අතරේ ව්‍යාජ උද්යෝගයක් නිතර වර්ධනය වේ. එම නිසා අපට ක්‍රිස්තුස් වහන්සේ සිටින සේක. යහපත් හෘදය සාක්ෂිකයක් ද ඇත. අපගේ ක්‍රියාමාර්වල දී ඉවසලිවන්තව සිටීමට ඉඩහැර ඇත. සමාදානයේ කාරණා සඳහා අපි ගොඩනගන්නෙමි. එක්සත්කම (ඒකත්වය) ප්‍රවර්ධනය කිරීමට සටන්ව දින්නෙමි කියා බොහෝ කාලයක් සිට පවසන්නෝය. අපගේ ස්වාමීන් වහ්නසේ උන්වහ්නසේගේ සෙනඟ එකත්වයක් ඇතිව උන්වහන්සේ සමඟ සිටින පිණිස දැඩි උද්යෝගයකින් යාච්ඤා කළ සේක. එම නිසා වැය කිරීමක් නොකර එය කළ නොහැකිය.

## උන්වහන්සේගේ මහිමය තුළ පවතින්න.

මෙම පදවල අවසාන වශයෙන් යේසුස් වහ්නසේගේ සෙනඟ උන්වහන්සේ සමඟ සිට උන්වහන්සේගේ මහිමය තුළ ඔවුන් පවතින පිණිසත් යාච්ඤා කළ බව අපි දකින්නෙමු. උන්වහන්සේ මෙසේ යාච්ඤා කළ සේක. **"පියාණෙනි..., ඔබ වට දුන් මහිමය ඔබ වට දුන්නාවූත් විසිනුත් දක්නා පිණිස මා සිටින තැන ඔවුනුත් මා සමඟ සිටිනවාට කැමැත්තෙමි.... "**

අපගේ ස්වාමීන් වහන්සේගේ අපූර්ව වූ මෙම යාච්ඤාව අද්විතීය වූ අලංකාරයක් සහ සිත් සසල කරවන නිමාවකින් යුක්ත වූ සේක. එය අසන්නා වූ අයට සැනසිල්ලත්, ප්‍රබල සතුටකුත් ඇතිවන බව අපි විශ්වාස කරන්නෙමු. එමෙන්ම එයට පංගුකාරයන්වීමට වේගයෙන් ඇදී ඒමට ශක්තියක් ලබාදෙන සේක. එම නිසා මේ මොහොතේ වුවත් එය කියවන්නා වූ සියලුදෙනාට උන්වහ්සේගේ යාච්ඤාවට පංගුකාරයන්වමෙන් සම්පූර්ණ වූ සතුටත් වචනයෙන් කිව නොහැකි සැනසිල්ලත් ලැබේ.

දැන් අපි උන්වහන්සේව නොදකින්නෙමු. නමුත් අපි උන්වහන්සේව කියවන්නෙමු. උන්වහන්සේට ඇහුම්කන් දෙන්නෙමු. උන්වහන්සේ තුළ විශ්වාසය ඇතිව සිටින්නෙමු. උන්වහන්සේගේ කාර්යය සම්පූර්ණවීම තුළ අපි නිදහසේ රැඳී සිටින්නෙමු. අපට එය ඉතාම යහපත් වුවත් ගමන් කරන්නේ ඇදහිල්ල කරුණුකොටගෙන මිස අපේ පෙනීමෙන් නොවේ. එමෙන්ම අපගේ පැකිලෙන්නා වූ, අවිශ්වාසයෙන් යුතු දුර්වල වූ ඇදහිල්ල නිතරම ස්වර්ගීය ක්‍රියා මාර්ගවලට ගමන් කිරීම බෙලහීන කරන්නා වූ බාධාවක්ව තිබේ. එක් දවසකදී මේ සියලු කාරණාවල පවතින තත්ත්වය අවසාන වන්නේය. ක්‍රිස්තුස් වහන්සේව උන්වහන්සේ සිටින ආකාරයනේම සදාකාලයටම අපි දකින්නෙමු. අපි උන්වහන්සේව හඳුණන ලෙස තවදුරටත් අපි දැනගන්නෙමු. අඳුරේ කණ්ණාඩියක් තුළින් නොව අපි උන්වහන්සේ ඉදිරියේ මුහුණට මුහුණ සිටින්නෙමු. අපි සැබවින්ම උන්වහ්නසේගේ අභිමුඛත්වයේ උන්වහ්නසේගේ සමාගමේ සිටින අතර එයින් ඈත්ව නොයන්නෙමු. ඇදහිල්ල ප්‍රසන්නව පවතින්නේ නම් වඩා වැඩියෙන් අපි දකින්නෙමු. බලාපොරොත්තුව සිත්ගන්නා ලෙස පවතින්නේය. වඩා වැඩියෙන් විශ්වාසය නිශ්චිතවම පවතින්නේය. පාවුල්තුමා මෙලෙස ලියා තිබීම පුදුමයක් නොවේ. **"එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමඟ ස්වාමීන් වහ්නසේ සම්මුඛ වන පිණිස වලාකුල්වලින් අහසට ඇදගනු ලබන්නෙමුව, මෙසේ අපි නිතරම ස්වාමීන් වහන්සේ සමඟ සිටින්නෙමුව. ඉන් නිසා මේ වචන වලින් එකිනෙකා සනසාගනිල්ලා"** (1 තෙසලෝනික 4:17-18)

දැන් අපි ස්වර්ගය පිළිබඳව ස්වල්ප වශයෙන්

7 පිටුවට

6 පිටුවෙන්

# ක්‍රිස්තුස් වහන්සේගේ මහත් ...

අවබෝධ කරගෙන ඇත. අපගේ සියලු සිතුවිලි වයාකුලත්වයට පත්ව තිබෙනවිටදීත් පව්කරුවන්ව සම්පූර්ණයෙන්ම වරදින් නිදහස් කිරීමේ අනාගතයේ දී පැමිණෙන තත්ත්වය තුළ සතුටුවීමට උත්සාහ දරමු. **"ප්‍රේමවන්තයෙනි, දැන් අපි දෙවියන් වහන්සේගේ දරුවෝය. අපි කොයි ආකාර අය වන්නේමුදැයි තවමත් ප්‍රකාශ වී නත. උන්වහන්සේ ප්‍රකාශවුනාම අපි උන්වහන්සේට සමාන වන බව දනිමුව. එක්නිසාද උන්වහන්සේ සිටින ආකාරයටම අපි උන්වහන්සේ දකින්නෙමුව."** (1 යොහාන් 3:2) එම නිසා මරණයෙන් පසු ක්‍රිස්තුස් වහන්සේ සමඟ සදාකාලේටම රැඳී සිටි මේ ආශිර්වාදත් ජීවිතය ගැන සිතමු. ආශිර්වාදලත් තැනැත්ත වහන්සේ අප උදෙසා උපත ලබා, අප වෙනුවෙන් මරණයට පත්වී නැවත මළවුන්ගෙන් ගැටිටුණු සේක. එහි කිසිදු ආකාරයක අඩුවක් නොමැත. දාවිත් බලවත් ලෙස මෙසේ කීවේය. **"ඔබ මට ජීවන මාර්ගය දක්වන සේක. ඔබ අබිමුඛයෙහි ප්‍රීතියේ සම්පූර්ණකම ඇත්තේය. ඔබගේ දකුණු පැත්තෙහි සදාකාලේටම සැපත ඇත්තේය."** (ගීතාවලිය 16:11) මෙම අනර්ඝ වූ යාච්ඤාව පිළිබඳව සාකච්ඡාව අවසන් කිරීමට පෙර ආකර්ෂණීය වූ මහත් ආයාචනාවේ අඩංගු කාරණා තුන නැවත මතක් කර ගනිමු. ශුද්ධකමට ඉඩහරින්න. ඒකත්වය කරුණු කොටගෙන ක්‍රියා කරන්න. ක්‍රිස්තුස් වහන්සේගේ මහිමය දරාගෙන අවසානය දක්වා උන්වහන්සේගේ සමාගම තුළ සිටින්න. මෙම කාරණා වලින් අපගේ සිතුවිලි, අපගේ මනස ඇත්කර නොගනිමු. අපි ජීවත්වන අතර අනිත් සියල්ලට වඩා ස්වාමීන් වහන්සේගේ මහිමය දරාගෙන අවසානය දක්වා උන්වහන්සේගේ සමාගම තුළ සිටින්න. මෙම කාරණා වලින් අපගේ සිතුවිලි, අපගේ මනස ඇත්කර නොගනිමු. අපි ජීවත්වන අතර අනිත් සියල්ලට වඩා ස්වාමීන් වහන්සේගේ ශුද්ධකම තුළ ප්‍රීතිවෙමු. එවිට අපි මරණයට පත්වෙද්දී සදාකාලයටම උන්වහන්සේගේ සමාගමට අයිති වන්නෙමු.

# "ස්වාමීන් වහන්ස ..... පහළට වැඩිය මැනව අපි වැරදී කර ඇත්තෙමු."

**"ඔබගේ මාර්ගවලදී ඔබ සිහි කරන්නාවූ අයට ඔබ සම්බවන සේක. මෙන්න ඔබ කෝපවූසේක. අපි පව් කළෙමුව. බොහෝ කලක සිට අපි ඒවායේ පැවතුණෙමුව. අපට ගැලවීම ලැබේද .. ? අපි සියල්ලෝම අපවිත්‍ර කෙනෙකු මෙන් වී සිටිමුව. අපේ සියලු අධර්මිෂ්ඨකම්ද කිළුටු වස්ත්‍රයක් මෙන්ය. අපි සියල්ලෝම කොළයක් මෙන් පරවෙමුව. අපේ අයුතුකම්ද සුළඟ මෙන් අප පහකරගෙන යයි. ඔබගේ නාමය කියා යාච්ඤා කරන්නා වූ ඔබ අල්වා ගන්න පිණිස තමාව ප්‍රබෝධ කරගන්නා වූ කිසිවෙක් නැත. එක්නිසාද ඔබවහන්සේ ඔබගේ මුහුණ අපෙන් සඟවා අපේ අපරාධ නිසා අප දියව යන්නට හැරියසේක."** (යෙසායා 64:5:7)

මෙහිදී අපි දෙවියන් වහන්සේ සමඟ සාකච්ඡාවට යොමුවීම අත්‍යාවශ්‍යවේ. යොසායගේ ඉලක්කය වූයේ දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟව බැහැ දකින පිණිස පහළට පැමිණීමට උන්වහන්සේව කැමති කරවා ගැනීම වූයේය. නමුත් දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟ සමඟ කථාබහ කිරීට අකමැති වුණේ සහ උන්වහන්සේගේ මුහුණ ඔවුන්ගෙන් සඟවා ගත්තේ ඇයි .. ? යෙසායා මෙම ප්‍රශ්නය අවබෝධ කරගැනීමත් සමඟ මෙම යාච්ඤාව තුළට එය ඇතුළත් කර ගත්තේය. ඔහු වටා තිබුණා වූ කාරණාවලට වාසි ලබාගැනීමට ඉඩ හැරියේ නැත. ඒ නිසා යෙසායා කෙලින්ම මෙසේ කීවේය. **"අපි පව්කර ඇත්තෙමු."** (යෙසායා 64:5) ඊට ටිකකට පසුව ඔහු මෙලෙසත් ඊට එකතු කළේය. **"..... එක්නිසාද ඔබවහන්සේ ඔබගේ මුහුණ අපෙන් සඟවා අපේ අපරාධ නිසා අප දියව යන්ට හැරිය සේක. "** (යෙසායා 64:7)

අපි කථා කරන්නේ දෙවියන් වහන්සේව මගහැර ගෙන ඇති අතර උන්වහන්සේව උවමනාවී තිබෙන බවයි. අපි දෙවියන් වහන්සේ කෙරෙහි රැඳී බලා සිටීම අවශ්‍යව තිබුණත් අපි උන්වහන්සේව මුණගැසීමෙන් ඈත්ව ගොස් සිටින්නෙමු. මෙම සියලු කාරණා අපි අපගේ ජීවිතවල පාපයට යොමුවීම මත ප්‍රධාන වශයෙන් රදා පවතින බව අපි අවබෝධ කරගත යුතුය. මෙය අතිශය වැදගත් කාරණයකි. අපි අපගේ පාපය පිළිගෙන එයින් හැරෙන්නට අදහස් කරන්නේ නැතිනම් පිඹීදීම පිළිබඳව කථාකිරීම නතර කළ යුතුය.

අතීත කාලයේ දී රජතුමා තමන්ගේ සෙනඟව බැහැදැකීමට පැමිණෙන්නේ නම් ඔහුට පෙරටුවෙන් පණිවිඩ කරුවෙකුට යවමින් ඒ බව දැනුම් දෙන සේක. මනුෂ්‍යයන් රජුගේ පැමිණීම වෙනුවෙන් අධික වේගයෙන් ගොඩනැගීම් කරනු ලබන්නෝය. ඔවුහු මිටියාවත් (හෙල්) පුරවා උස්තැන් සමතලා කරනු ලබති. ඇද තැන් කෙලින් කරනු ලබති. ගල් අහක් කරනු ලබන අතර බිම පෙරළා රළු තැන්වලින් ගල් මුල් අයින් කරනු ලබති. රතුමාගේ පැමිණීමට අධික වේගයෙන් සූදානම් වන්නෝය.

අපව බැහැදැකීමට පැමිනීමට ස්වාමීන් වහන්සේට අවශ්‍යව තිබෙන සේක. අපගේ ජීවිත සහ අපගේ සභාවන් දෙවියන් වහන්සේගේ මහිමාන්විත අභිමුඛත්වයෙන් පූර්ණ කිරීමට උන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. නමුත් අපි ඒ සඳහා මාර්ගය සූදානම් කරගත යුතුය. උන්වහන්සේගේ සෙනඟ අතරේ සෑම කෙනෙක්ම ඒ උදෙසා වැඩ කළ යුතුය. අපි අපගේ පව්කාර මිටියාවත පුරවාගත යුතුය. උඩඟුකම නැමති උස්තැන් සමතලා කළ යුතුය. දෙවියන් වහන්සේගෙන් පිටත තිබෙන්නා වූ වංක ස්ථාන උන්වහන්සේගේ කැමැත්තෙන් පුරවාගත යුතුය. අපි සෑමදෙනාම අපගේ රාගය, ඊර්ෂ්‍යාව, නොරිස්සුම, කෑදරකම නැමති ගල් සහ මුල් ඉවත්කර දැමිය යුතුය. එලෙස අපට කරන්නට වැඩ තිබේ. **"කාන්තාරයෙහි ස්වාමීන් වහන්සේගේ මාර්ගය සාදා අපේ දෙවියන් වහන්සේට වනයෙහි මාවතක් සමතලා කරපල්ලා. සියලු මිටි තැන් උස්වන්නේය. සියලු කඳු හා හෙල් පහත් කරනු ලබන්නේය. අඳ තැන් අඳ හරිනු ලබන්නේය. රළු තැන් සමතලා කරනු ලබන්නේය. එවිට ස්වාමීන් වහන්සේගේ තේජස ප්‍රකාශ වන්නේය. සියලු මනුෂ්‍යයෝ එක්ව එය දකින්නෝය. එක්නිසාද ස්වාමීන් වහන්සේගේ මුඛය එය වදාළ සේකැයි මොරගසන්නෙකුගේ හඬක් වන්නේය. "**(යෙසයා 40: 3-5)

නමුත් පාපය සමග කටයුතු කිරීමට පහසු කාර්යයක් නොවේ. පහසුවෙන් "මම වරදක් කර ඇත්තෙමි. " යන කුඩා වචන කිහිපය පවසන්නා වූ කිසිවෙකව අප අතරේ සොයා ගැනීමට නුපුළුවන. ඒ වචන ප්‍රකාශ නොවී අපගේ උගුරේ හිරවී තිබෙන නිසා විවාහයන් නිතරම ඉකිගසා මරණයට පත්වන්නේය. මිත්‍ර සබඳකම් නිතරම සැකය සමඟ අසහනය ඇති කරන (පැසවන) නිසා සහ සිතේ චංචල බව අතිකරන නිසා මේ වචන ප්‍රකාශ කිරරීමට අකමැතිව සිටින සභාවන් මේ වචන හිඟව සිටින නිසා පරස්පරවාදීව දෙපිලකට බෙදී සහ අංශබාග තත්ත්වයට නිතරම පත්ව සිටිති. කොපමණ දුෂ්කර වුවත් අපි ඒවා පැවසිය යුතුය. හදවතින්ම පැවසිය යුතුය. යොසායාගෙන් අපි මෙය ඉගෙන ගත යුතුය. ඔහු නිකං වචන කියුවේ නැත. ඔහු සැබෑ ලෙස පසුතැවිලි වෙමින් එසේ කිරීමේදී නියමාකාරයෙන් පසුතැවිලි වූයේ කෙසේදැයි බලන්න.

## (1) පාපය සැබෑ ලෙස හෙළිකිරීම

යෙසායාගේ භාෂාව ඉතා පැහැදිලිව පාපය ව්‍යාප්තව තිබෙනවා දැකීම කෙලින්ම ඉදිරිපත් කරන්නේය. පාපය ඔවුන් අභිබවා ජයග්‍රහණය කර ඇති අතර එම ජයග්‍රහණය මුලින්ම පැහැදිලි වූයේ ඔවුන්ගේ හැසිරීමේ සාමාන්‍ය අපිරිසිදුකම තුලිනි. (යොසායා 64:6)

යෙසායා මේ අපවිත්‍ර හැසිරීම් දෙආකාරයකින් දකින්නේය. ප්‍රථමයෙන් ඔහු එහි මූලාශ්‍රය කෙරෙහි සැලකිල්ල දක්වා ඇත්තේ අපගේ අපවිත්‍රකමේ ස්වභාවය වෙතටයි. **"අපි සියලුදෙනාව අපවිත්‍ර කෙනෙකු මෙන්වී සිටින්නෙමු."** ඔහු පැවසුවේ අපගේ පරම්පාරවේ පාපිෂ්ඨ ක්‍රියාවන් කරුණුකොටගෙන මේ පව්කාර ස්වභාවයට අපි පත්ව සිටිනවා කියාය. දිය උල්පත අපවිත්‍රව ඇති බැවින් දොළ පාරවල් ද අපවිත්‍රව තිබේ. මේ ආකාරයෙන්

රොජර් එල්ස්වර්ත් විසිනි.

කථා කරමින් පසුතැවිලි වෙනවාට වඩා වැඩියෙන් වර්තමාන මනුෂ්‍යයා හේතුවක් නැතිව කෝපයට පත්ව සිටින්නෝය. මනුෂ්‍යයාගේ යහපත්කමේ පදනම වශයෙන් ප්‍රිය වචන කථා කිරීම පිළිබඳව අපි පවසන්නෙමු. මනුෂ්‍යයන් අසාර්ථක වුවහොත් එය ඔහුගේ අධ්‍යාපනයේ හෝ පරිසරයේ ඇති ඌණතාවයක් සහ පව්කාර ව්‍යසනයක් ලෙස අර්ථ දැක්විය යුතු නැත. එසේ අර්ථ දක්වන්නේ නම් මනුෂ්‍යයාගෙ මහත් වූ අවශ්‍යතාවය පාපයෙන් ගලවනු ලැබීම නොවන හොඳ සමාජ සංස්කෘතියක් සහ හොඳ අධ්‍යාපනයක් ලබාදීම බවට පත්වේ.

ඇත්තටම මනුෂ්‍යයාගේ පාපිෂ්ඨ වූ ඉගැන්වීම්වල ස්වභාවය පහසුවෙන් මනුෂ්‍යයාට හිංසාකාරී විය හැකිය. ඒ හේතුවේ ඔහුට තමාගේම හැඟීම් පිළිබඳව පහත් ස්වභාවයක් දැනේ. එම නිසා මනුෂ්‍යයාට පාපයෙන් ගැලවීම පමණක් නොව නමුත් පහත් හැඟීම්වලිනුත් ගලවනු ලැබීම අවශ්‍යවන්නේ යැයි යෝජනා කළ හැකිය. ඒ කාලය අතරතුරදී මනුෂ්‍යයන් පාපයට ගොදුරුවීම නිසා අත්හරිනු ලබන අතර එහි ප්‍රතිඵලය ලෙස මහත් විනාශයන්ට සහ බිඳවැටීමට හේතුවී ඇත. ඒ අතරම ඔහුගේ වර්ධනය පිළිබඳව අභිමානය සහ සංවර්ධනයවීමේ හැකියාව ගැන කතා කරනු ලබයි. ඔහු වටා ඇති ඔහුගේ සමාජීය කීර්තිය, බලය ක්‍රමක්‍රමයෙන් බිඳවැටෙයි.

කිතුණුවන්ට ඔවුන්ගේ පාප ගැන සමාව ලැබී ඇත. නමුත් ඔවුන්ගේ උපතින්ම ඇති පව්කාර ස්වභාවය මැකී ගොස් නැත. එය ප්‍රබල බලපෑමක් ඇති කරන අතර කිතුණුවන් අපෝස්තුළු පාවුල් සමඟ නිරන්තරයෙන් මොර ගැසීම අවශ්‍ය බව දැකිය හැකිය. **"අනේ, මව කාලකණ්ණි මනුෂ්‍යයෙක්ය. මේ මරණයේ ශරීරයෙන් මා මුදන්නේ කවුද..... ?"** (රෝම 7:24) මෙය සැලකිල්ලට ගනිමින් අපගේ ඇදහිල්ල ක්‍රියාවට නැඟීමට ඇති ඉඩ ප්‍රස්ථාව වෙතට හැරීමට යෙසායා තුලින් පොළඹවනු ලබයි. එය වර්ධනය කර ගැනීම අපට ඇති හොඳම ක්‍රියා මාර්ගයයි. යොසායා මෙසේ කීවේය. **"අපේ සියලුව ධර්මිෂ්ඨකම් ද කිළුටු වස්ත්‍රයක් වෙන්ය."** මේ ප්‍රකාශය හේතුකොටගෙන චාර්ල්ස් ස්පර්ජන් අදහසක් පලකළේය. සහෝදරයෙනි, අපේ තම ධර්මිෂ්ඨකම ඉතා අයහපත් නම්, අපගේ අධර්මිෂ්ඨකම කොයි ආකාර විය හැකිද ... ?

එම නිසා ගැඹුරින් අපගේ ආවේණික පාප වෙත සහ අප කරන්නා වූ සියලුම දෝෂයන් (කැළැල්) ගැන කොපමණ අවධානය දිය යුතුද ... ? දේවධර්මාචාර්යවරු මිනිසාගේ සම්පූර්ණ පිරිහීම ගැන හොඳින් කතා කළහ. ඔවුන් අදහස් කළේ මනුෂ්‍යයා තමන්ට හැකි උපරිම අන්දමින් නරක බව නොව ඔහු කරන සෑම දෙයකින්ම ඔහුගේ පව්කාර ස්වභාවය පෙන්නුම් කරන බවයි. චාර්ල්ස් ස්පර්ජන් නැවතත් මෙසේ කීවේය. අපගේ තම ශුද්ධකම තුළ පාපය තිබේ. අපගේ ප්‍රේමය තුළ වෛරය තිබේ. අපගේ ගෙවත්තේ ලස්සනම මල් මත සර්පයාගේ සෙවල තිබේ.

8 පිටුවට

Reg. No: DOP/NEWS/21/2023
30/7,A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.



7 පිටුවෙන්

# "ස්වාමීන් වහන්ස .....

මෙය මෙම සිදුවීමේ සඳහන්ව ඇති කාරනාවල එක් කොටසක් (භාගයක්) **පවසී. අනිත් කොටස (භාගය) යෙසායා විසින් වෙලෙස පොළඹවන්නා වූ වචන වලින් දක්වා ඇත. "ඔබගේ නාවය කියා යාච්ඤා කරන්නා වූ ඔබ අල්ලා ගන්න පිණිස තවාව ප්‍රබෝධ කරගන්නා වූ කිසිවෙක් නැත. වක්නිසාද ඔබවහන්සේ ඔබගේ වුහුණ අපෙන් සඟවා අපේ අපරාධ නිසා අප දියව යන්ට හැරිය සේක."** (යෙසායා 64:7) ඔවුන්ගේ හැසිරීම්වල අපවිත්‍රකමත් ඊට එකතු කර ඇත. ඔවුන්ගේ හදවත් වල උදාසීනත්වය පිළිබඳ යෙසායා පසුතැවිලි විය. ඔවුන් දෙවියන් වහන්සේ තුළ යාච්ඤා කිරීමෙහි රැඳී සිටීමට, උන්වහන්සේගේ සමාවදීම සෙවීමට, උන්වහන්සේගේ පොරොන්දු වෙනුවෙන් ආයාචනා කිරීමට වඩා අවශ්‍ය වෙනත් දෙයක් නොමැත. ඒ නිසා මෙම ඉල්ලීම උදෙසා උත්සාහ දරන්නේය. එබඳු ආකාරයේ කාරණා ඉටු කිරීමට ඔහු තමාගේම ජීවිතය උද්යෝගිමත් කරගත්තේය. මෙය ඔහුගේ ජීවිතයේ ප්‍රධාන දෙය කරගත්තේය.

යම් කෙනෙක් තමා ගැනම තක්සේරු කරගත යුතු අතර ඔහු තම ජීවිතයේ ඉඩදී ඇති පාපයෙන් අසනීපවී තමා මේ ආකාරයෙන් නොයන බව තිරණය කළ යුතුය. නමුත් යොසායාගේ පරම්පාරවේ අය කිරීමට සූදානම් නොවූයේද මෙයයි. ඔවුන් සිටියේ අවදිවීමට නොහැකි තරම් නිදිමතක වූයේය.

විචාරකයෙක් වූ ඇල්බට් බාර්න්ස් මේ ආකාරයෙන් කීවේය. කිසිම මනුෂ්‍යයෙක් උත්සාහයකින් තොරව දෙවියන් වහන්සේ ඉදිරියේ නැගී නොසිටින අතර මනුෂ්‍යයන් මේ සඳහා උත්සාහයක් නොගත්තොත් ඔවුන් පාපයේ අනුවනකමට ගොඳුරුවේ. එය නිදිමතව සිටින මනුෂ්‍යයෙක් නැවත ගැඹුරු නින්දට වැටෙන්නාක් මෙන්වේ.

මේ මනුෂ්‍යයන් ඊළඟට සාතන්ගේ මරනීය ග්‍රහණයට හසුවන්නේය. එක් පැත්තකින් ඔවුන් සියලු ආකාරයේ අපවිත්‍ර කාරණාවලට සම්බන්ධ වන්නෝය. අනිත් පැත්තෙන් ඔවුන් ස්වාමීන් වහන්සේ සමීපයේ දී සීතලව සිටින්නෝය. පාපයේ අධිකාරි බලය එක අතක තබාගෙන අනිත් අතින් පාපය අත්හැරීම තබාගෙන සිටිති. එය කොයිතරම් විනාශකාරී එකතුවක්ද ... ? වර්තමානයේ දෙවියන් වහන්සේගේ සෙනඟගේ ජීවිත තුළ ගණන් කළ නොහැකි තරම් අවස්ථාවලදී නැවත, නැවත මේ තත්ත්වය පවතින්නේය. සැබෑ පසුතැවිලිවීම නැතිව මේ වංකකමට සම්බන්ධ වී සිටින්නෝය. ඒ දෙකම විවෘතව ප්‍රකාශ කරන අතර එසේ නැති නම් සමාවදීම ප්‍රතික්ෂේප කරයි. එම නිසා යොසායාගේ සැබෑ පසුතැවිලිවීම කරුණුකොටගෙන පැහැදිලි කරන්නා වූ තවත් වැදගත් අංශයක් දෙස අවධානය යොමු කරමු.

## (2) වරදින් මුදාගනු ලැබීම.

යෙසායා ඔහුගේ ජාතියේ පාපය වයාප්තව තිබූ බව දුටුවේය. එමෙන්ම විනිශ්චය පවතින බව පිළිගත්තේය. යෙසායා මෙලෙස පැවසුවේය. **"ඔබගේ මාර්ගවලදී ඔබ සිහිකරන්නා වූ අයට ඔබ සම්බවෙන සේක. වෙන්න ඔබ කෝප වූ සේක. අපි පව් කළෙමුව. බොහෝ කලක සිට අපි ඒවායේ පැවතුණෙමුව."** (යොසායා 64:5) ඔහු ඇත්තටම දෙවියන් වහන්සේට කෝපය ආරෝපණය කරයි. මෙය විශ්මයෙන් සහ බියෙන් පූර්ණව තිබෙන්නේය. දෙවියන් වහන්සේ උදහස්වන සේක්ද .. ? ඔව්, බයිබලය අපට නැවත නැවත දෙවියන් වහන්සේ පාපයට විරුද්ධව සිටින බව පෙන්වා දෙන අතර අපිත් පාපය ප්‍රතික්ෂේප කරනු ඇතැයි විශ්වාස කරන සේක. දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් අපි පිඹීදීමත් සමඟ පාපය විනිශ්චය කිරීමට උන්වහන්සේ ඉල්ලා සිටින ශුද්ධකම ගැන අපට අමතකවී ඇත. තම හිස වැල්ලේ සඟවාගෙන දඩයම් කරුවන්ගෙන් බේරී ඇතැයි සිතන පැස්බරා මෙන් අපි මෝඩයන් වන්නෙමු. ඔබ මෙසේ පැවසිය හැකිය. මම කැමැතියි දෙවියන් වහන්සේ ප්‍රේමයේ දෙවියන් වහන්සේ හැටියට සිතන්න. මම සහතිකවම දන්නවා ඔබත් එසේ සිතීමට කැමති බව නමුත් පැස්බරාගේ රෝගයේ ලක්ෂණ කවදා හෝ තිබුණා නම් එය සිදුවේ. ප්‍රේමණීය දෙවි කෙනෙකු පමණක් ලැබීමට ප්‍රිය කිරීම උන්වහන්සේ පාපය විනිශ්චය කිරීමට පොරොන්දු වුනා වූ දෙවියන් වහන්සේ බව කිසිසේත්ම ප්‍රතික්ෂේප කරන්නේ නැත. දෙවියන් වහන්සේගේ කෝපය පිළිබඳව යොසායා ඔහුගේ ස්ථීර සහතිකයෙන් තම සෙනඟට පෙන්වීමට උපමා දෙකක් භාවිතා කර ඇත. එකක් "සුළඟ" වන අතර (යොසායා 64:6) අනික් එක ගින්න වේ. (යොසායා 64:2,7)

දෙවියන් වහන්සේගේ සෙනඟ පාපයට නැඹුරුවී සහ ස්වාමීන් වහන්සේ තුළ උද්යෝගිමත් වෙනවා වෙනුවට උදාසීනකමට ඇළුම්වී වර්ධනයවීම නිසා ඔවුන් කොළයක් මෙන් පරවීමට පටන්ගෙන ඇත. ඔවුන්ගේ ආත්මික ශක්තිය පිරිහීමට පටන්ගෙන සහ ඊළඟට විනිශ්චයේ සුළඟ කරුණුකොටගෙන පිටතට ගසාගෙන යාමට පටන්ගෙන ඇත.

දෙවියන් වහන්සේගේ සුළඟේ විනිශ්චය කරුණුකොටගෙන යෙසායාගේ කාලයේ සෙනඟ බැබිලෝනියට රැගෙන යන ලදි. එවැනි ප්‍රතිවිපාකයකට ඔවුන් මුහුණ දුන්නේ ඔවුන්ගේ අභක්තික ජීවන රටාව නිසාය. ඔවුන් ගීතිකාකරුවාගේ වචනවල සත්‍යතාවය ප්‍රදර්ශනය කර දක්වයි. යම් කෙනෙක් ස්වාමීන් වහන්සේගේ ව්‍යවස්ථාවේ වචනවල ආකාරයට ප්‍රීතිමත් වන විට... , **"ඔහු දිය ඇලවල් ළඟ හිඳවූ නියව කලට එළඳෙන නොවැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේය. ඔහු කරන සියල්ල සවල වෙයි."** (ගීතාවලිය 1:3 ) එමෙන්ම අභක්තිකකම මේ ආකාරයෙන් පවතින බවද සඳහන් කර ඇත. එනම්, **"දුෂ්ඨයෝ එසේ නොව සුළඟින් විසිර යන බොල් හා සමානය"** (ගීතාවලිය 1:4)

ඊළඟට යෙසායා ගින්න නිරූපණය කරයි. ඔහු කිව්වා..., **"දෙවියන් වහන්සේ අපේ අපරාධ නිසා අපව දියව යන්නට හැරිය සේක."** කියලා ගින්න බයිබලයේ විනිශ්චය සම්බන්ධව පොදු සංඛේතයකි. වේදනාව සහ සන්තාපය, පැමිණෙන්නාවූ විනිශ්චය පිළිඹිබු කරන්නේය. නමුත් ගින්නේ විනිශ්චය බලාපොරොත්තුවේ මූලිකාංගත් දරා සිටින්නේය. රත්තරං ගින්නට දැමූවිට අපවිත්‍ර ලෝහ පහවී පවිත්‍ර වන්නේය. අපි දෙවියන් වහන්සේගේ සෙනඟ වශයෙන් දෙවියන් වහන්සේගේ ගින්න සම්පූර්ණයෙන්ම අපව දියව යන්නට හැරීමේ අදහස නැවත අලුත් කරනු ලබයි.

මෙහිදී මම ඔබට සහතිකකොට කාරණයක් කියන්නට අවශ්‍යව තිබේ. දෙවියන් වහන්සේගේ කෝපය සහ භාවිතා කර තිබෙන රූපාලංකාර පිළිබඳව යෙසායා දෙවියන් වහන්සේ සමඟවාද කරන්නේ නැත. ඔහු දෙවියන් වහන්සේගේ කෝපය ඒත්තු ගත්තේය. නමුත් දෙවියන් වහන්සේට එය සුදුසු නැහැ කියා ඔහු උන්වහන්සේට දෝෂාරෝපණය කළේ නැත. ඔවුන්ගේ පාපය මතුපිට දෙවියන් වහන්සේගේ කෝපයේ නිවැරදි බව පිළිබඳව වාද කිරීමට ගියේ නැත. මෙහිදී අපි සැබෑ හදවතකින් පසුතැවිලි විය යුතුය. සැබෑ පසුතැවිලිවීම සැමවිටම දෙවියන් වහන්සේට ගෞරවය ගෙන දෙයි. එයින් උන්වහන්සේ දෙවියන් වහන්සේ බව අවබෝධ කරගනු ලබන්නේය. උන්වහන්සේ සාධාරණ දෙවියන් වහන්සේ බව අවබෝධ කරගනු ලබන්නේය. තවත් ආකාරයකින් පවසන්නේ නම් පසුතැවැලිවීම දෙවියන් වහන්සේට විරුද්ධව වාද කිරීම නතර කරන්නාවූ එක් කාරණයකි. එමෙන්ම පසුතැවිලිවීම මැවුම්කරුවාණන් ඉදිරියේ මැවිල්ල තමාගේ ස්ථානයේ සිටීමයි.

ඔබ දෙවියන් වහන්සේට විරුද්ධව ඔබව ආරක්ෂකා කර ගැනීමට උනන්දු වනතෙක් පසුතැවිලිවීම සහ එයින් ගෙන දෙන සාමය, ප්‍රීතිය ඔබ කිසිදා අත්දකින්නේ නැත. "ඒක සාධාරණ නොවේ. එම නිසා දෙවියන් වහන්සේ ඒක කරන්නේ කොහොමදැයි මම නොදනිමි. "කියා පැවසීම පසුතැවිලිවීමට ආගන්තුක පුද්ගලයෙකුගේ හැගීම වේ. **පසුතැවිලි වෙන්න. එවිට දේව වචනයේ සඳහන් වෙව ප්‍රකාශය පිළිබඳව ඔබගේ දැනුවත්කම ප්‍රකාශ වේ. "වක්නිසාද වාගේ යෝජනා නුඹලාගේ යෝජනා නොවේය. නුඹලාගේ මාර්ග ද වාගේ මාර්ග නොවේ යැයි සවාමීන්වහන්සේ කියන සේක. අහස පොළොවට වඩා උස්ව තිබෙන්නාක් මෙන් වාගේ මාර්ග නුඹලාගේ මාර්ගවලටත් වාගේ යෝජනා නුඹලාගේ යෝජනාවලටත් වඩා උසස්ව තිබේ. "** (යොසායා 55:8-9) ඊළඟට යෙසායගේ යාච්ඤා කිරීම තුළ ස්වාමීන් වහන්ස බැස ආව මැනව යන ප්‍රකාශයට අපි කැමති නම් එය අල්ලා ගත යුතුය. අපි අපගේ පව් ගැන මතුපිටින් පසුතැවිලි නොවී අවංක සිතින් එය කළ යුතුය.

අපි අපගේ පව් ගැන මතුපිටින් පසුතැවිලි නොවී අවංක සිතින් එය කළ යුතුය. එමෙන්ම දෙවියන් වහන්සේගේ විනිශ්චය සාධාරණ සහ යුක්ති සහගත බව අවබෝධ කරගෙන **"ස්වාමීන් වහන්ස බැස ආව මැනව අපි වැරදි කර ඇත්තෙමු....."** කියා අද දවසේ අපගේ යාච්ඤාව විය යුතුය.

## වැදගත් දැන්වීමක්...

**පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.**

**මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.**

**අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.**

**ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.**

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

**මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47 දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.**